# ශ්‍රී ලංකාවේ වී අලෙවි ගැටළුව පිළිබඳ විමසුමක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අත්දැකීම් ඇසුරින්

එම්.කේ. නදීකා දමයන්ති


## සංක්ෂේපය

වී නිෂ්පාදනයේ දෙවැනි විශාලතම දිස්ත්‍රික්කය වන පොළොන්නරුව ශ්‍රී ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයෙන් 15% ට ආසන්න ප්‍රමාණයක් නිපදවයි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය පිළිබඳ ගැටළුව අස්වනු නෙළන කාල සීමාව තුළ වඩාත් ඉස්මතු වේ. මෙය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රධාන ගැටළුවක් බවට පත්ව ඇත. වී අලෙවි ගැටළුව කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අමතරව සමාජයීය මෙන්ම දේශපාලනික ක්ෂේත්‍රයේද ගැටළු සහ උණුසුම්කාරීබවක් මතු කරවන්නක් බවට පත්ව ඇත. පසුගිය කාලය තුළ වී අලෙවි ගැටළුව නිසා සිදුවූ උද්ඝෝෂණ, උපවාස, පෙළපාළි ආදී දේශපාලන ක්‍රියාකාරකම් බොහෝ දුරට නිර්මාණය වූයේ පොළොන්නරුව ආශ්‍රිතවයි. වී අලෙවි ගැටළුව කෙරෙහි බලපා ඇති කරුණු අතර වී නිෂ්පාදනය කරන අනිකුත් ප්‍රධාන දිස්ත්‍රික්කයන්ට පසුව පොළොන්නරුවේ වී අස්වැන්න වෙළෙඳපොළට නිකුත් වීමත්, වීවල අඩු ගුණාත්මක තත්ත්වයත් ප්‍රධාන වේ. තවද, ප්‍රවාහන හා මාර්ග පද්ධතියේ ගැටළු, ඇසුරුම්කරණ ගැටළු, පිටතින් වෙළෙඳුන් නොපැමිණීම සහ වී මෝල් හිමියන් මූල්‍යමය වශයෙන් මුහුණ දෙන ගැටළු ද බලපෑම් කරයි. පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ 2002 / 2003 මහ කන්නය සහ 2003 යල කන්නය ආශ්‍රිතව සිදු කෙරුණු 'පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය' පිළිබඳ අධ්‍යයනය මෙම ලිපියට පදනම් වී ඇත. වී අලෙවියේදී ගොවීන්, අතරමැදි වෙළඳුන් සහ වී මෝල් හිමියන් මුහුණපාන ගැටළු සහ එම ගැටළු සඳහා ඔවුන් වෙතින් ඉදිරිපත් වන විසඳුම් පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරේ.


## හැඳින්වීම

දේශීය ආහාර පරිභෝජන රටාව තුළ සහල් ප්‍රමුඛ ස්ථානයේ පසුවේ. මෙම හේතුව මත වී වගාව දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ මූලික ස්ථානයක් හිමි කරගෙන ඇත. අනෙකුත් සියළුම කෘෂි බෝගවලට වඩා වැඩියෙන් රටේ සියලු ප්‍රදේශවල ව්‍යාප්තව පවතින වී වගාව යල, මහ දෙකන්නය ඇතුළත්ව ශ්‍රී ලංකාවේ සමස්ත වගාබිම්වලින් 42% ක් (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2004) පමණ ආවරණය කරනු ලබයි. වී නිෂ්පාදන කෙරෙන ප්‍රධාන දිස්ත්‍රක්කයන්හි වැඩි බිම් ප්‍රමාණයක් වගා කෙරෙනුයේ මහා වාරිමාර්ග ක්‍රම යටතේය. වී වගා කෙරෙන ප්‍රධාන දිස්ත්‍රික්කයන් වන අම්පාර, පොළොන්නරුව, අනුරාධපුරය, මඩකලපුව, ත්‍රිකුණාමලය සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක අතුරින් වී වගා බිම් ප්‍රමාණය අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කය දෙවැනි වන්නේ අම්පාර දිස්ත්‍රික්කයට පමණි. 2005 යල සහ 2005/2006 මහ කන්නය ආශ්‍රිතව සලකා බැලීමේදී

මෙම අධ්‍යයනය ආරම්භයේ අධ්‍යයන සම්බන්ධීකාරක ලෙස කටයුතු කළ එස්.ඩබ්.ජී.කේ. බුලංකුලම මහත්මියට කර්තෘගේ ස්තුතිය පිරිනැමේ.

ප්‍රධාන වී නිෂ්පාදන දිස්ත්‍රික්කයන්හි වෙළඳපොළ සඳහා වන වී අතිරික්තය ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 968,000 ක් විය. එය දිස්ත්‍රික්ක අනුව පහත සඳහන් පරිදි වේ. කුරුණෑගල (42,000), අම්පාර (271,000), පොළොන්නරුව (257,000), අනුරාධපුර (297,000), හම්බන්තොට (101,000) ආදී වශයෙනි. අම්පාර දිස්ත්‍රික්කයෙන් වැඩි වී ප්‍රමාණයක් වෙළෙඳපොළට නිකුත් කෙරුණ ද ප්‍රථම වී අස්වැන්න නිකුත්වන දිස්ත්‍රික්කය අම්පාර වන හෙයින් වී අලෙවිය පිළිබඳ විශාල ගැටළුවක් ඒ ආශ්‍රිතව ඉදිරිපත් නොවේ. එසේ වුවද වී නිෂ්පාදනය කරන අනෙකුත් ප්‍රධාන දිස්ත්‍රික්කයන් ආශ්‍රිතව වී අලෙවිය සම්බන්ධව බොහෝ ගැටළු ඉස්මතු වේ. මේවා ඇතැම් විට ගොවීන්ගේ සිය දිවි නසා ගැනීම්, උද්ඝෝෂණ සහ උපවාස, මෙන්ම ආණ්ඩු බලය මාරු කිරීම් සඳහා වන තීරණාත්මක සාධකයක් දක්වා වර්ධනය වන අවස්ථා දකිය හැක. ශ්‍රී ලංකාවේ සමස්ත වී නිෂ්පාදනයෙන් 15% (ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව - 2004) ආසන්න ප්‍රමාණයක් නිෂ්පාදනය කෙරෙන්නේ පොළොන්නරුව දිස්ත්‍රික්කයෙනි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී වෙළඳපොලට නිකුත්වීම සිදුවන්නේ අවසානයට වන අතර විශේෂයෙන්ම විශාල වී අස්වැන්නක් වෙළඳපළට නිකුත්වන මහ කන්නය ආශ්‍රිතව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය පිළිබඳ ගැටළු මතුවේ.

රජය විසින් පසුගිය කාලයේදී පොළොන්නරුව දිස්ත්‍රික්කය ඇතුළු තවත් දිස්ත්‍රික්ක ගණනාවක මතුවන වී අලෙවිය පිළිබඳව ගැටළුව විසඳීම සඳහා විවිධ පියවරයන් ගෙන ඇත. ඒ අතර 1971 අංක 14 දරණ පනතින් වී අලෙවි මණ්ඩලය පිහිටුවීම මගින් ගොවියාගේ වී සාධාරණ මිලකට මිලදී ගැනීම සහ පාරිභෝගිකයින්ට සාධාරණ මිලකට සහල් සැපයීමට කටයුතු කිරීම, සමූපකාර සමිති, ගොවි සංවිධාන සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා වී මිලට ගැනීමට දිස්ත්‍රික් ලේකම්වරුන් මාර්ගයෙන් රජය විසින් මුදල් ලබාදීම මගින් වී මිල කෙරෙහි බලපෑමක් කිරීමට උත්සාහ කිරීම, අලෙවි සවිය වැනි වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ මෙරටට ආනයනය කරන සහල් ප්‍රමාණය සීමා කිරීම සහ බදු පැනවීම මෙන්ම සහල් අතිරික්තයක් පවතී නම් අපනයනය කරන සහල් වෙනුවෙන් අපනයන පාරිතෝෂිකයක් (Export Rebate) ලබාදීමට පියවර ගැනීම ඒ අතර ප්‍රමුඛ වේ. 1970-1977 කාලය තුළ වී අලෙවි මණ්ඩලය මගින් වී නිෂ්පාදනයෙන් 25% ට අධික ප්‍රමාණයක් මිලට ගෙන ඇත. 1948 දී වී සඳහා වන සහතික මිල ශත 38 සිට 1972 වන විට ශත 72 දක්වාත්, 1993 වන විට රු.7.42 ක් දක්වාත් ඉහළ ගොස් ඇත (කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍යාංශය: 1998). වී මිල පහත වැටීම වැළැක්වීම සඳහා රජය විසින් දිස්ත්‍රික් ලේකම්වරු මාර්ගයෙන් වී මිලට ගැනීම සඳහා මුදල් නිකුත් කිරීම මගින් මේ වන විට රාජ්‍ය අංශයේ මැදිහත්වීම සිදුකරනු ලබයි. මේ යටතේ 2005 වසරේ වී මිලට ගැනීම සඳහා යල කන්නයේදී රුපියල් දශ ලක්ෂ 1,251 සහ මහ කන්නයේදී රුපියල් දශ ලක්ෂ 1,325 ක් වියදම් කර ඇත. මෙම මුදල්වලින් මහ කන්නයේදී වී මෙට්‍රික් ටොන් 83,000 (අස්වැන්නෙන් 04%) ආසන්නව ද, යල කන්නයේදී මෙට්‍රික් ටොන් 52,000 (අස්වැන්නේන 04%) ආසන්නව ද, මිලට ගෙන ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව, 2005). එමෙන්ම 2005/2006 මහ කන්නය තුළ වී නිෂ්පාදනයෙන් 04%

ට ආසන්න ප්‍රමාණයක් මිලට ගෙන ඇති අතර මිලට ගත් ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්ක අනුව වෙනස් වේ. එනම්, ඒ ඒ දිස්ත්‍රික්කයන් හි වෙළඳපොළ අතිරික්තයෙන් අනුරාධපුර (16.7%), පොළොන්නරුව (27.1%), අම්පාර (18.2%), හම්බන්තොට (18.5%), කුරුණෑගල (12.1%) ආදී වශයෙනි. මෙයට අමතරව 2004/2005 මහ කන්නය සඳහා වී මෝල් හිමියන් ලබා ගත් බැංකු ණය පියවීමේ කාලය දීර්ඝ කිරීම, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ වී මිලට ගැනීම සඳහා එක් අයෙකුට ලබා දුන් ණය මුදල මහ කන්නයේදී රුපියල් දශ ලක්ෂ 25 සිට 50 දක්වා වැඩි කිරීම හා විශේෂිත මිල යටතේ වී මිලට ගැනීම සඳහා එම ණය සීමාව යල කන්නයේ සිට රුපියල් දශ ලක්ෂ 75 දක්වා වැඩි කිරීම (ශ්‍රී ලංකා මහ බැංකුව, 2005) මගින් පුද්ගලික අංශය මගින් වී මිලට ගැනීම දිරිමත් කිරීමට ද උත්සාහ දරා ඇත. එමෙන්ම ග්‍රාමීය කර්මාන්තයක් ලෙසින් සහල් සැකසුම් ගම්මාන පිහිටුවීම මගින් ද සහල් පිටි ආශ්‍රිත ආහාර නිෂ්පාදන දිරිමත් කිරීමට නොයෙකුත් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මගින් ද වී අලෙවි ගැටළුව සඳහා පිළියම් යෙදීමට කටයුතු කර ඇත.

**අරමුණු**

ඉහත කී තත්ත්වයන් යටතේ වුවත් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ වී අලෙවිය පිළිබඳ ගැටළුව මහ කන්නයේ අස්වනු නෙළීමත් සමගම සෑම වසරකම පාහේ ඉස්මතු වේ. එම නිසා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය පිළිබඳ ගැටළුව පිළිබඳ අධ්‍යයනය කිරීම කාලීන වැදගත් කමකින් යුක්ත වන අතර මෙම ලිපියෙහි මූලික අරමුණ වන්නේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී ගොවීන්, වී මිලදී ගැනීමේ නිරත අතරමැදි වෙළඳුන් සහ වී මෝල් හිමියන් වී අලෙවි ක්‍රියාවලියේදී මුහුණ දෙන ගැටළු සහ දුෂ්කරතා මෙන්ම එම ගැටළු මගහරවා ගැනීම සම්බන්ධයෙන් ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද විසඳුම් පිළිබඳව තර්කාන්විතව විමසා බැලීමය.

මෙම ලිපියට අදළ තොරතුරු මූලික වශයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් 2002 - 2003 මහ කන්නය පසුබිම් කර ගනිමින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය හා සම්බන්ධයෙන් කරනු ලැබූ අධ්‍යයනයන් ආශ්‍රයෙන් ලබාගත් ඒවාය. එම අධ්‍යයනයේදී දත්ත රැස්කිරීම සඳහා අනුගමනය කළ ප්‍රධාන ක්‍රමය වූයේ ප්‍රශ්නාවලි මාර්ගයෙන් තොරතුරු ලබා ගැනීම වූ අතර ඒ සඳහා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන් 500ක්, වී මිලට ගැනීමේ නිරත අතරමැදි වෙළඳුන් 38ක් සහ වී මෝල් හිමියන් 38 දෙනෙකු සම්බන්ධ කර ගැණිනි. ගොවීන් තෝරා ගැනීමේදී දිස්ත්‍රික්කයම නියෝජනය වන පරිදි ගොවිජන සේවා බල ප්‍රදේශ පහක ග්‍රාම නිළධාරී කොට්ඨාශ දහයක් පදනම් කර ගැනිණි. (වගු සටහන් අංක 01 න් අදළ ගොවිජන සේවා බල ප්‍රදේශ සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශ දක්වේ. මෙහිදී කුඹුරු ඉඩම් හිමි නාම ලේඛන මත පදනම්ව අක්කර 5, 3, 2 1/2, 2 සහ 01 යනාදී ලෙස කුඹුරුවල විශාලත්වය සලකා අහඹු ලෙස ගොවීන් තෝරා ගන්නා ලදී. එම අධ්‍යයනය

සඳහා දත්ත ලබා ගත් අනෙකුත් ක්‍රමයන් වන්නේ දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සම්බන්ධ රාජ්‍ය නිලධාරීන් මෙන්ම කදුරුවෙල ප්‍රදේශයේ වී අලෙවියට සමබන්ධ තැරැව්කරුවන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණයන්ය.

**වගු සටහන් අංක 01: 2002 - 2003 වර්ෂයේදී හෙ.කො.ගො.ප.පු. ආයතනය මගින් කරනු ලැබූ අධ්‍යයනය සඳහා තෝරාගත් ප්‍රදේශ**

| දිස්ත්‍රික්කය තුළ නියෝජනය වන ප්‍රදේශ | ගොවිජන සේවා බලප්‍රදේශ | ග්‍රාම නිලධාරී කොට්ඨාශ |
|---|---|---|
| උතුරු කොටස | මැදිරිගිරිය | බේබියාවැව<br>දියසෙන්පුර |
| නැගෙණහිර කොටස | මනම්පිටිය | අසේලපුර වීරාන |
| දකුණු කොටස | ඇලහැර - බකමූණ | ඉකිරිවැව<br>අතරගල්ලැව |
| බස්නාහිර කොටස | හිඟුරක්ගොඩ | අක්කර හැත්තැව<br>හිඟුරක බණ්ඩාරගම |
| මධ්‍යම කොටස | සේවාගම | ලක්ෂ උයන<br>සිංහරාජපුර |

**වී අලෙවිය හා සම්බන්ධ ගැටළුවෙහි ස්වභාවය**

මෙයට පෙර ද සඳහන් කර ඇති පරිදි සමස්තයක් ලෙස සළකා බැලූවිට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී නිෂ්පාදනය දෙවැනි වන්නේ අම්පාර දිස්ත්‍රික්කයට පමණි. විශාල වී අස්වැන්නක් සීමිත කාලයක් තුළ වෙළඳපොළට නිකුත්වීම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවි ගැටළුව සඳහා බලපානු ලබන ප්‍රධාන සාධකයකි. එමෙන්ම මෙම අස්වැන්න වෙළඳපොළට නිකුත්වන්නේ අම්පාර, අනුරාධපුර වැනි අනෙකුත් දිස්ත්‍රික්කයන්හි වී අස්වැන්න වෙළඳපොළට නිකුත් වීමෙන් පසුව වීම ද මේ සඳහා බලපෑම් කරනු ලබන තවත් මූලික සාධකයකි. මෙම හේතු මත පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවි ගැටළුව සෑම වර්ෂයකම පාහේ වී අස්වනු නෙළීම සමඟ ඉස්මතු වේ.

මෙම ගැටළුව 'අලෙවිය' සම්බන්ධව පැන නගින ගැටළුවක් පමණක් නොවන අතර සමාජ, ආර්ථික, දේශපාලන ආදී බහුපැතිමානයන්ගේ ගැටළුවක් බවට පත්ව ඇත. මෙරට ප්‍රධානම සංස්කෘතික උත්සවය වන සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සව සමය ආසන්නයේදී මහ කන්නයේ වී අස්වැන්න නෙළීම සිදුවේ. මෙරට ගොවීන්ගෙන් අති බහුතරයකගේ එකම ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්තය වන හෙයින් ඔවුන්ගේ පරිභෝජන සහ අනෙකුත් අවශ්‍යතාවන් සපුරා ගැනීමට

සිදුවන්නේ කෘෂිකාර්මාන්තය මගින් උපයා ගන්නා ආදයමිනි. විශේෂයෙන්ම කෘෂි සමාජය හා බැඳී පවතින සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය ආශ්‍රිතව සිදුකෙරෙන වත් පිළිවෙත් සහ සමාජ යුතුකම් ඉටුකිරිමේදී ඇවැසි මුදල්මය අවශ්‍යතා සපුරා ගැනීමට ගොවීන්ට සිදු වන්නේ මහ කන්නයේ අස්වනු අලෙවිය මගිනි. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද හා බැඳී සමාජ චාරිත්‍ර වාරිත්‍ර හා යුතුකම් ඉටු කිරීමට නොහැකිවීම ගොවීන් මානසික පීඩාවන්ට පත් කිරීමට මෙන්ම සමාජමය වශයෙන් කොන්වීමකට ලක්වීමට ද කිසියම් අන්දමකට බලපෑම් කරනු ලබයි. එමෙන්ම වී වගාව සඳහා මෙන්ම අස්වනු නෙළීම සඳහා ද ගොවීන් ණයගැතිභාවයට පත්වීම සුලභ සිදුවීමකි. අස්වනු අලෙවිය තුළින් තම ණයගැතිභාවයෙන් නිදහස්වීමට ඔවුන් අපේක්ෂා කරන අතර එසේ ණයගැතිභාවයෙන් නිදහස්වීමට නොහැකිවීම සමාජ අවමානයක් වශයෙන් මෙරට කෘෂි සමාජය තුළ බොහෝ විට සැළකේ. මෙම තත්ත්වය හමුවේ තම අස්වනු සාධාරණ මිලකට අලෙවි කර ගැනීමට නොහැකිවීම හෝ කිසිදු මිලකට අලෙවි කර ගැනීමට නොහැකිවීම යන ගැටළුවලට මුහුණදීමට ගොවීන්ට සිදුවන අතර එය කෘෂි සමාජය තුළ අසහනකාරී තත්ත්වයක් මෙන්ම ගොවි පවුල් තුළ විවිධාකාරයේ ගැටළු සහ ප්‍රශ්න මතුකිරීමට හේතු පාදක වේ. ගොවීන්ගේ සියදිවි නසා ගැනීම දක්වා මෙම අලෙවි ගැටළුව බලපෑම් කරනු ලබන බවට පසුගිය දශකයක පමණ කාලයක සිට එදිනෙද පුවත්පත් මගින් වාර්තා ඉදිරිපත් කරනු ලබයි. මෙම පසුබිම මත 1994 දී එච්.එම්.සී. කපිලරත්න මහතාගේ සභාපතිත්වයෙන් යුතුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ සියදිවි නසා ගැනීම් පිළිබඳ සොයා බැලීමට ඒක පුද්ගල කමිටුවක් පත් කිරීම දක්වා දේශපාලන අධිකාරිය යොමු කිරීමට මෙම ගැටළුව බලපෑම් සහගත විය.

මෙයට අමතරව ප්‍රධාන වී වගා දිස්ත්‍රික්කයන් ආශ්‍රිතව, බොහෝ විට පොළොන්නරුව දිස්ත්‍රික්කය ආශ්‍රිතව වී අලෙවි ගැටළුව මත සිදුවන ගොවීන්ගේ සංවිධානාත්මක උද්ඝෝෂණ, උපවාස, විරෝධතා ව්‍යාපාර අස්වනු නෙළන සමය ආශ්‍රිතව බොහෝවිට දකිය හැක. මෙම තත්ත්වය ඇතැම් අවස්ථාවලදී ආණ්ඩු බලය මාරු කිරීම සඳහා දයක වන තීරණාත්මක සාධකයක් දක්වා වර්ධනය වීමේ හැකියාවකින් ද යුක්ත වේ. මේ අනුව මෙරට වී අලෙවි ගැටළුව අලෙවි ගැටළුවක් පමණක් නොවන අතර සමාජ හා දේශපාලන ගැටළුවක් බවට ද මේ වන විට පත්ව ඇති බව පෙනේ.

## වී අලෙවියේදී ගොවීන් මුහුණ දෙන ගැටළු

වී අලෙවියේදී ගොවීන් මුහුණ දෙනු ලබන ගැටළු ඇසුරුම් කිරීමේ සිට වී අලෙවිකර මුදල් ලබාගැනීම දක්වා වූ ක්‍රියාදමය පුරාම පැතිර පවතී. ඇසුරුම් කිරීම, ප්‍රවාහන ගැටළු මෙන්ම ගබඩාකරණය පූර්ව අලෙවි අවස්ථාවේදී ගොවීන් මුහුණ දෙන ගැටළු අතර ප්‍රධාන වේ.

## පූර්ව අලෙවි ගැටළු

### ඇසුරුම්කරණය සම්බන්ධ ගැටළු

අධ්‍යයනයට ලක් කළ ගොවීන් සම්බන්ධ වූ නියැදියෙන් 92.4% ක් ඇසුරුම්කරණය සම්බන්ධ වූ විවිධ ගැටළුවලට මුහුණ දෙන බව අනාවරණය විය. වී ඇසුරුම් කිරීමේදී ගොවීන්ගෙන් 98% ක් පොහොර උර භාවිතා කරන අතර ඉතිරි පිරිස ගෝනි පාවිච්චි කරනු ලබයි. ගොවීන්ගෙන් 93% ක්ම වී ඇසිරීම සඳහා පාවිච්චි කරනු ලබන්නේ තමන් සතු ඇසුරුම් මළු වන අතර වී මිලදී ගන්නන් සතු ඇසුරුම් මළු භාවිතා කරන්නේ 7% තරම් සුළු පිරිසකි. වී ඇසුරුම්කරණය සඳහා භාවිතා කරනු ලබන හිස් පොහොර උරයක දළ වශයෙන් කිලෝ ග්‍රෑම් 50-60 අතර වී ප්‍රමාණයක් අසුරනු ලැබිය හැකිය. එසේ වුවද අසුරනු ලබන වී වර්ගය මත අසුරන ප්‍රමාණය වෙනස් වේ. රුපියල් 15.00-20.00 ත් අතර මිලකට මිලදී ගන්නා හිස් පොහොර උරයක් උපරිම වශයෙන් කන්න දෙකකට වඩා භාවිතා කිරීමට නොහැකිවීම නිසා (ඇසුරුම් මළු විනාශවීම නිසා) වාර්ෂිකව ඉහළ මිලක් ඇසුරුම් සඳහා භාවිතා කිරීමට සිදුවීම පූර්ව අලෙවි අවස්ථාවේදී ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවකි. ඇසුරුම් මළුවල මිල ප්‍රදේශයෙන් ප්‍රදේශයට වෙනස් වන අතර හිඟුරක්ගොඩ සහ මනම්පිටිය ගොවිජන සේවා බල ප්‍රදේශවලදී ඇසුරුම් මල්ලක සාමාන්‍ය මිල රු. 15.00 - 20.00 අතර වේ. මැදිරිගිරිය ගොවිජන සේවා බලප්‍රදේශයට අයත් බේබියාවැව ප්‍රදේශයේ එම මිල රු. 18.00-20.00 ක් අතර වේ. අධ්‍යයනයට ලක්වූ අනෙකුත් ප්‍රදේශවල ඇසුරුම් මල්ලක සාමාන්‍ය මිල වන්නේ රු.18.00 කි. මේ අනුව ඇසුරුම් සඳහා වාර්ෂිකව ඉතා ඉහළ මිලක් වැය කිරීමට ගොවීන්ට සිදුවී ඇත. එමෙන්ම අලෙවියෙන් පසු නැවත ලැබෙන මළු හොඳ තත්ත්වයේ නොවීම හෝ ඒවා නැවත නොලැබීම ඇසුරුම් සම්බන්ධව ගොවීන් මුහුණ දෙන අනෙකුත් ගැටළු වේ.

රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන්ගෙන් 43.8% (219) ඇසුරුම් සම්බන්ධ ගැටළුවලට මුහුණ දෙනු ලබයි. ගොවීන්ගේ 29.2% (146) සඳහන් කරනුයේ රාජ්‍ය අංශයට වී අලෙවි කළ පසු තමන්ට නැවත ඇසුරුම් මළු නොලැබෙන බවය (වගු සටහන් අංක 03). නියැදියෙන් 11.2% ක් රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන්ට ඇසුරුම් මළු ලැබුණ ද තමන් ලබාදුන් අළුත් ඇසුරුම් මළු වෙනුවට ලැබෙන් ඇසුරුම් මළු ප්‍රයෝජනයකට ගත නොහැකි පරණ ඒවා බව සඳහන් කරනු ලබයි. මෙම ගැටළුවට මුහුණදෙනු ලබන ගොවීන් සඳහන් කරනුයේ එවැනි ඇසුරුම් මළු හෝ ලබා ගැනීමට ප්‍රවාහන වියදම් දරා ගනිමින් කිහිප වතාවක් අදළ ආයතන වෙත යාමට සිදුවීම තම අත්දැකීම බවයි.


කෙසේ වුවද පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ඇසුරුම් මළු නැවත ලබා ගැනීම ගැටළුවක් ලෙස සඳහන් කර ඇති ප්‍රතිශතය සමස්ත නියැදියෙන් 0.2% ක් පමණි. මේ අනුව පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ඇසුරුම් මළු සම්බන්ධ ගැටළුවකට මුහුණදීමට සිදු නොවන අතර ව්‍යාපාරිකයන් තම ඇසුරුම් මළුවලට වී ඇසිරීම එයට හේතු වී ඇත.

## ප්‍රවාහන ගැටළු

මෙයට පෙර අධ්‍යයනයන්හිදී ද වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළුවක් ලෙසින් ප්‍රවාහන වියදම් අධික වීම අනාවරණය කර ඇත (Bogahawatta - 1985, Somarathna -1987). අධ්‍යයනයට ලක්වූ නියැදියෙන් 99.3% (497)ක් තමන් කිසියම් අන්දමක ප්‍රවාහන ගැටළුවකට මුහුණ දෙන බව සඳහන් කර ඇත. මෙම ප්‍රවාහන ගැටළු අතර ප්‍රවාහන වියදම් අධිකවීම, නිසියාකාර මාර්ග පහසුකම් නොමැතිවීම, ප්‍රවාහන පහසුකම් හිඟය ප්‍රධාන කරුණු වේ. මෙයට අමතරව වී ප්‍රවාහනය කළයුතු දුර ප්‍රමාණය වැඩිවීම, ප්‍රවාහනයේ පවතින අඩු කාර්යක්ෂමතාව හේතු කොට ගෙන නිසි වේලාවට ප්‍රවාහනය කරගත නොහැකිවීම ප්‍රවාහනය සම්බන්ධයෙන් ගොවීන් මුහුණ දෙනු ලබන අනෙකුත් ගැටළු වේ. නියැදියෙන් 41%ක ඉහළ වියදමක් ප්‍රවාහනය වෙනුවෙන් දැරීමට සිදුවීම තම ගැටළුව ලෙසින් සඳහන් කර ඇති අතර ගොවිජන සේවා බල ප්‍රදේශ අනුව විමසීමේදී නගරයට තරමක් ආසන්නව පිහිටි හිඟුරක්ගොඩ ප්‍රදේශයේ ගොවීන් 52%ක් ද ඇලහැර - බකමූණ ප්‍රදේශයේ ගොවීන් 49%ක් ද මෙම ගැටළුවට මුහුණ දෙනු ලබයි. සමස්ත නියැදියෙන් 39%ක් ප්‍රවාහනය සම්බන්ධව තමන් මුහුණ දෙන ගැටළුව ලෙසින් මාර්ග පහසුකම් නොවීම සඳහන් කර ඇත. මැදිරිගිරියේ බේබියාවැව සහ දියසෙන්පුර ප්‍රදේශවලදී මෙය 51%ක් තරම් ඉහළ අගයක් ගනී (ප්‍රස්ථාර අංක 01).

වී මිල කෙරෙහි බලපෑම් කරුනු ලබන සාධක අතර ඉහළ ප්‍රවාහන වියදම මෙන්ම දුර්වල තත්ත්වයේ මාර්ග පහසුකම් ද වේ. එනම් වී ප්‍රවාහනය සඳහා විශාල මුදලක් වැය කිරීමට සිදුවීම, සාපේක්ෂව ඉහළ මිලක් ගෙවන ස්ථානවලට වී ප්‍රවාහනයකර අලෙවි කිරීමේදී නිසි වේලාවට ප්‍රවාහනයකර ගැනීමට නොහැකිවීම නිසා ආපසු රැගෙන ඒමට සිදුවීම ආදී හේතුන් නිසා අඩු මුදලකට හෝ කමතේදී හෝ නිවසේදී වී අලෙවි කිරීමට ගොවීන් පෙළඹී ඇත.

**ප්‍රස්ථාර අංක 01: ප්‍රවාහන මාධ්‍ය භාවිතයේදී මුහුණ දෙන ගැටළු (ගොවිජන සේවා බල ප්‍රදේශ අනුව)**




මූලාශ්‍ර: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය, 2006, හෙ.කො.ගො.ප.පු. ආයතනය

වී ප්‍රවාහනය සඳහා ගොවීන් භාවිතා කරනු ලබන මාධ්‍ය වන්නේ රෝද හතරේ ට්‍රැක්ටරය සහ අත් ට්‍රැක්ටරයයි. ගොවීන් විසින් වී ප්‍රවාහනය කිරීමේදී ප්‍රවාහන මාධ්‍ය ලෙසින් අත් ට්‍රැක්ටරය (72.6%) බහුලව යොදා ගනු ලබන අතර 22.9%ක් රෝද හතරේ ට්‍රැක්ටරය යොදා ගනු ලබයි. සුළු වශයෙන් වී අලෙවි කිරීමේදී මෙන්ම අලෙවි මධ්‍යස්ථානය ඉතා සමීපව පිහිටා ඇති අවස්ථාවන්හිදී ශ්‍රමය හෝ පාපැදි (4%) උපයෝගී කර ගනිමින් වී ප්‍රවාහනය කරනු ලබයි. මනම්පිටිය සහ ඇලහැර/බකමූණ ප්‍රදේශවල වී ප්‍රවාහනය සඳහා ගොවීන් විසින් විශේෂයෙන් වියදම් දැරීමක් සිදු නොකරන අතර, ගොවිපලේ සිට නිවසට වී ප්‍රවාහනය කරනුයේ කොළ මැඩීම කරන ලද ට්‍රැක්ටර්කරුවන් විසිනි. මෙම ප්‍රදේශවල ගොයම් කැපීම, පෑගීම, අට්ටි ගැසීම, නිවසට රැගෙන ඒම යන සියළු කාර්යයන් ප්‍රථමයෙන් ගිවිසගත් මුදලකට සිදුකරනු ලබයි. එමෙන්ම මෙම ප්‍රදේශවල පවතින ප්‍රවාහන අපහසුතා නිසා වෙළඳ මධ්‍යස්ථාන කරා වී ගෙනයාම ඉතා අඩුවෙන් සිදුවන අතරම නිවසට පැමිණෙන වෙළඳුන්ට වී විකිණීම සිදු කෙරේ. සමීක්ෂණයට භාජනය කළ අනෙක් ප්‍රදේශවල වී ප්‍රවාහනය සඳහා බහුලව භාවිතා කෙරෙනුයේ තමන්ගේ හෝ කුලියට ලබාගත් අත්ට්‍රැක්ටරයයි.

වී ප්‍රවාහනය කිරීමේදී ගොවීන් වී මල්ලකට හෝ වී තොගයකට වශයෙන් මුදල් ගෙවීම සිදු කරනු ලබයි. ගොවීන් සමඟ සිදුකරන ලද අවිධිමත් සම්මුඛ සාකච්ඡා මඟින් හෙළි වූ අන්දමට ප්‍රවාහන වියදම් ගෙවීමේදී වී කිලෝ ග්‍රෑම් 50 ක වී මල්ලක් කිලෝ මීටරයක් හෝ එයට අඩු දුරක් ප්‍රවාහනය කිරීම සඳහා රු.10.00 -12.00 දක්වා මුදලක් ගෙවීමට සිදු වේ. මේ අනුව වී කිලෝ ග්‍රෑම් එකක් කිලෝ මීටරයක දුරක් ප්‍රවාහනය කිරීම සඳහා ගොවීන්ට දැරීමට සිදුවන මුදල ශත 20-24 අතර වේ. ප්‍රදේශය, ප්‍රවාහන මාධ්‍යය, මාර්ග පහසුකම් මෙන්ම වී මල්ලකට හෝ තොගයකට ගෙවීම ආදී විවිධ හේතු සාධක අනුව වී ප්‍රවාහන වියදම වෙනස් වේ. වී ප්‍රමාණයේ හෝ ප්‍රවාහන දුරෙහි වැඩිවීමත් සමඟ ගොවීන් වී ප්‍රවාහනය සඳහා දරණ වියදම ද ඉහළ යයි.


ගොවීන්ගෙන් 10.6%ක් රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන වෙත වී ප්‍රවාහන වියදම් දැරීමට සිදුවීම ගැටළුවක් ලෙසින් සඳහන් කරනු ලබයි. ප්‍රවාහන වියදම අධිකවීම, වී මිලට ගැනීම ප්‍රමාදවීම නිසා ප්‍රවාහන මාධ්‍යයන්ට වැඩිපුර මුදල් ගෙවීමට සිදුවීම, වී මිලට ගන්නා මධ්‍යස්ථානයන්ට පවතින දුර වැඩිවීම නිසා වැඩි ප්‍රවාහන වියදමක් දැරීමට සිදුවීම සහ එම වියදම ගොවියාට දරා ගැනීමට සිදුවීම, විවිධ හේතු ඉදිරිපත් කරමින් වී තොග නැවත හරවා එවීම නිසා කිහිපවතාවක් ගෙන යාමට වියදම් දැරීමට සිදුවීම ආදිය මෙම ගැටළුවට සම්බන්ධ අනෙකුත් කරුණු වේ. පෞද්ගලික අංශයේ වෙළඳුන් කමතට හෝ නිවසට පැමිණ වී මිලට ගැනීම නිසා පෞද්ගලික අංශයට වී අලෙවියේදී ගොවීන්ට මෙම වියදම් දැරීමට සිදු නොවේ. මෙයට අමතරව වී බෑම, අට්ටි ගැසීම ආදී කාර්යයන් සඳහා තම වියදමින් ශ්‍රමිකයන් යොදවා ගැනීමට සිදුවීම රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී මතුවන ගැටළුවක් ලෙසින් 14% ක් පෙන්වා දී ඇත. මෙම කුළී ශ්‍රමිකයින්ට කුලී ගෙවීමේදී වී තොගයකට මුදලක් හෝ දෛනිකව

කුලිය ගෙවීමට සිදුවේ. දෛනික කුලිය මේ සඳහා ගෙවනු ලබන්නේ නම් ආහාර සඳහා වන වියදම් ඇතුළත්ව එක් ශ්‍රමිකයෙකුට රුපියල් පන්සියයක පමණ මුදලක් මේ සඳහා ගෙවීමට සිදුවන බව ගොවීන්ගේ අදහසයි. මෙය අමතර වියදමක් ලෙස ගොවීන් පෙන්වා දෙන්නේ පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී තමන්ට එම වියදම දැරීමට සිදු නොවන හෙයිනි.

## රාජ්‍ය/පෞද්ගලික අංශයට වී අලෙවියේදී ගොවීන් මුහුණ දෙන ගැටළු

රාජ්‍ය සහ පෞද්ගලික යන දෙ අංශයටම වී අලෙවි කිරීමේදී මතුවන ගැටළු පිළිබඳව ගොවීන් කරුණු දක්වා ඇත. රාජ්‍ය අංශයට වී අලෙවියේදී තම වෙළඳපල අතිරික්තය සම්පූර්ණයෙන් රාජ්‍ය අංශය විසින් මිලට නොගන්නා හෙයින් ගොවීන්ට පෞද්ගලික අංශයට ද වී අලෙවි කිරීමට සිදුවේ. මේ නිසා ගොවීන් රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකෙහිම පවතින ගැටළු පිළිබඳව අවධාරණය කරනු ලබයි. වගු සටහන් අංක 02න් පෙන්නුම් කරන ආකාරයට අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගෙන් 95%ක් රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන් ගැටළුවලට මුහුණපානු ලබන බව සඳහන් කරයි. ඉතිරි 5% ක් කිසි දිනෙක රාජ්‍ය අංශයට වී අලෙවි නොකළ ගොවීන් හෝ සමුපාකාරවලට සම්බන්ධකම් තිබූ නිසා වී අලෙවි කර ගැනීමේදී ගැටළුවලට මුහුණ නොදුන් අයවේ. අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගෙන් 85% ට ආසන්න පිරිසක් පෞද්ගලික අංශයට වී අලෙවිකිරීමේදී මතුවන ගැටළු හා දුෂ්කරතා සම්බන්ධව සඳහන් කර ඇත. එයට අයත් නොවූ 15% ට වී එකතු කරන ව්‍යාපාරිකයන්ගේ සහ වී මෝල් හිමියන්ගේ ඥතීන්, හිතවතුන් හෝ දීර්ඝ කාලීනව ඔවුන් සමඟ වෙළඳ සබඳතා පවත්වන්නන් සහ බිත්තර වී නිෂ්පාදනය කරන්නන් ආදීන් ද ඇතුළත් විය.

**ප්‍රස්ථාර අංක 02 රාජ්‍ය / පෞද්ගලික අංශ වී අලෙවියේදී ගැටළුවලට මුහුණපෑම (ගොවිජන සේවා බලප්‍රදේශ අනුව)**




**මූලාශ්‍ර: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය, 2006 හෙ.කො.ගො.ප.පු. ආයතනය**

රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණදෙනු ලබන ගැටළු වගු සටහන් අංක 02 න් ද පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී මුහුණ දෙන ගැටළු වගු සටහන් අංක 03 න් ද පෙන්නුම් කෙරේ.

### වගු සටහන් අංක 02 : රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණදෙන ගැටළු (ගොවිජන සේවා බලප්‍රදේශ අනුව)

| ගැටළුව | ගොවිජන සේවා බලප්‍රදේශය (%) | | | | | සමස්ත නියැදියේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | හිගුරක්ගොඩ n -100 | මනම්පිටිය n -100 | මැදිරිගිරිය n -100 | සේවාගම n -100 | ඇලහැර/ බකමූන n -100 | n -500 |
| අඩු මිලක් ලැබීම | 3.0 | 6.0 | 11.0 | 6.0 | 2.0 | 5.6 |
| අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා ගුණාත්මක තත්ත්වය පරීක්ෂා කිරීම | 86.0 | 96.0 | 88.0 | 83.0 | 77.0 | 86.0 |
| මුදල් ලැබීමේ ප්‍රමාදය | 71.0 | 59.0 | 80.0 | 78.0 | 43.0 | 66.2 |
| අලෙවි කිරීමේ ප්‍රමාදය | 58.0 | 43.0 | 63.0 | 44.0 | 32.0 | 48.0 |
| ඇසුරුම් මළු සඳහා වියදම් දැරීමට සිදුවීම | 41.0 | 14.0 | 38.0 | 41.0 | 24.0 | 31.6 |
| ඇසුරුම් මළු නැවත ලබා ගැනීමේ ගැටළුව | 15.0 | 20.0 | 7.0 | 17.0 | 2.0 | 12.2 |
| ප්‍රවාහන වියදම් දැරීමට සිදුවීම | 5.0 | 20.0 | 10.0 | 7.0 | 11.0 | 10.6 |
| අමතර ශ්‍රමික කුලී ගෙවීමට සිදුවීම | 18.0 | 12.0 | 12.0 | 24.0 | 4.0 | 14.0 |
| නිලධාරීන්ගේ අක්‍රමිකතා අකාර්යක්ෂමතා | 20.0 | 33.0 | 24.0 | 37.0 | 8.0 | 24.4 |
| වීවලින් බර අඩු කිරීම | 18.0 | 23.0 | 25.0 | 27.0 | 18.0 | 22.2 |
| සීමිත ප්‍රමාණයක් මිලට ගැනීම | 6.0 | 4.0 | 4.0 | 4.0 | 0.0 | 3.6 |
| මිලට ගැනීමේ මධ්‍යස්ථාන නොවීම | 0.0 | 6.0 | 10.0 | 1.0 | 15.0 | 6.4 |

* එකම ගොවීන් පිළිතුරු කිහිපයක් සැපයීම නිසා මෙහි ප්‍රතිශත එකතුව සියයට සමාන නොවේ.

**මූලාශ්‍රය: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය, 2006, හෙ.කො.ගො.ප.පු. ආයතනය.**

### වගු සටහන් අංක 03: පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණදෙන ගැටළු (ගොවිජන සේවා බල ප්‍රදේශ අනුව)

| ගැටළුව | ගොවිජන සේවා බලප්‍රදේශය (%) | | | | | සමස්ත |
|---|---|---|---|---|---|---|
| | හිගුරක්ගොඩ n -100 | මනම්පිටිය n -100 | මැදිරිගිරිය n -100 | සේවාගම n -100 | ඇලහැර/ බකමූන n -100 | නියැදිය % n -500 |
| අඩු මිලක් ලැබීම | 74.0 | 76.0 | 88.0 | 87.0 | 59.0 | 76.8 |
| වෙළෙඳුන් කිහිප දෙනෙකු වෙළෙඳපොළ හැසිරවීම | 6.0 | 40.0 | 22.0 | 30.0 | 24.0 | 24.4 |
| වංචනික කිරුම්, මිණුම් භාවිතය | 5.0 | 29.0 | 14.0 | 10.0 | 8.0 | 13.2 |
| ගුණාත්මක තත්ත්වය සඳහා වීවලින් /මුදලින් අඩු කිරීම | 3.0 | 19.0 | 7.0 | 10.0 | 3.0 | 8.4 |
| තැරැව්කරුවන්ට මුදල් ගෙවීමට සිදුවීම | 1.0 | 0.0 | 0.0 | 0.0 | 0.0 | 0.2 |
| මුදල් ලැබීමේ ප්‍රමාද | 0.0 | 4.0 | 1.0 | 2.0 | 1.0 | 1.6 |
| ඇසුරුම් නැවත නොලැබීම | 0.0 | 0.0 | 1.0 | 0.0 | 0.0 | 0.2 |
| විකල්පයක් නොමැතිවීම | 0.0 | 1.0 | 0.0 | 1.0 | 1.0 | 0.6 |

**මූලාශ්‍රය: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය 2006, හෙ.කො.ගො.ප.පු. ආයතනය**

ඉහත වගු සටහන් අනුව රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගුණාත්මක තත්ත්වය දැඩිව පරීක්ෂා කිරීම. මුදල් ලැබීමේ ප්‍රමාදය, අලෙවි කිරීමේදී සිදුවන ප්‍රමාදයන්, ප්‍රවාහනය සහ ඇසුරුම් සඳහා අමතර වියදමක් දැරීමට සිදුවීම, නිලධාරීන්ගේ වංචනික ක්‍රියා සහ අක්‍රමිකතා, මිලදී ගැනීමේ මධ්‍යස්ථාන නගරයට ආසන්නව පිහිටීම ආදිය ගොවීන් මුහුණ දෙනු ලබන ප්‍රධාන ගැටළු වේ.

පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී අඩු මිලක් ලැබීම, කිරුම් මිණුම් වංචනික ආකාරයෙන් සිදු කිරීම, අඩු ගුණාත්මක තත්ත්වය සඳහා වීවලින් හෝ මුදලින් කිසියම් ප්‍රමාණයක් අඩු කිරීම ගොවීන් මුහුණ දෙන ගැටළු අතර ප්‍රධාන වේ.

**අඩු මිලක් ලැබීම**

පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන්ගෙන් 77% ආසන්න ප්‍රමාණයකට ලැබෙනුයේ අඩු මිලක් බව වගු සටහන් අංක 04 අනුව පැහැදිලි වේ. මැදිරිගිරියේදී ගොවීන් 88% සහ සේවාගමදී 87% තරම් ඉහළ ප්‍රතිශතයක් ද එම ගැටළුවට මුහුණදී ඇත. ගොවීන්ගෙන් 09% ක් වී කිලෝ ග්‍රෑමයකට ලබන සාමාන්‍ය මිල රු. 10.39ක් වන අතර ගොවීන්ගෙන් 10%ක් කිලෝ ග්‍රෑමයකට රුපියල් 12.70 ක් (සාමාන්‍ය මිල) වැනි මිලක් ලබා ගනී. ඉතිරි පිරිස ලබා ගන්නා සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 11.72 කි. එක් එක් ප්‍රදේශවල වී සඳහා අඩු මිල ගණන් ලැබීමට විවිධ හේතු බලපා ඇත. එම හේතු සාධක අතර තම එදිනෙදා අවශ්‍යතා සඳහා මුදල් අවශ්‍යවීම, වගාවන් සහ වෙනත් කටයුතු සඳහා වූ ණය පියවීමේ අවශ්‍යතාව මත අස්වනු නෙළූ විගස අලෙවි කිරීම, අඩු ගුණාත්මක තත්ත්වයක වී නිෂ්පාදනය කිරීම, ගබඩා පහසුකම් නොවීම, විකල්පයක් නොමැති නිසා පෞද්ගලික වෙළඳුන්ට අඩු මුදලට හෝ වී විකිණීමට සිදුවීම, ප්‍රවාහන අපහසුතා නිසා නිවසට පැමිණෙන වෙළෙඳුන්ට අඩු මුදලට වී අලෙවි කිරීමට සිදුවීම, වෙළඳපලට එකවර විශාල වී සැපයුමක් සිදුවීම, ව්‍යාපාරිකයන් සමග පවතින විවිධ සම්බන්ධතා ප්‍රධාන වේ. මෙහිදී ගොවීන්ගෙන් 78%ක් තම වී සඳහා අඩු මිලක් ලැබීමට හේතු වශයෙන් වෙළෙන්ද විසින් මිල තීරණය කිරීම සඳහන් කර ඇති අතර 9%ක් සඳහන් කර ඇත්තේ විශාල වී සැපයුමක් එකවර වෙළඳපළට සැපයීම මිල අඩුවීම කෙරෙහි බලපානු ලබන බවයි.

මෙයට අමතරව බේබියාවැව, අසේලපුර, වීරාන, අතරගල්ලෑව ප්‍රදේශවල මාර්ග සහ ප්‍රවාහන පහසුකම් දුර්වල තත්ත්වයක පවතින අතර වී මිලට ගැනීමට වෙනත් ප්‍රදේශවලින් පැමිණෙන වෙළඳුන් ප්‍රමාණය ද ඉතාම සීමිත වේ. මේ නිසා මෙම ප්‍රදේශවල වී වෙළඳපොළ තුළ දැඩි තරඟකාරිත්වයක් දක්නට නොමැති අතර වී සඳහා ලැබෙන මිල ද පහළ මට්ටමක පවතී. අධ්‍යයන සිදුකෙරෙන කාලය තුළ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ 2004 මහ කන්නයේ අස්වනු නෙළීම ආරම්භ වී තිබූ අතර ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් (කෘ.ප.නි.ස.) මාර්ගයෙන් ප්‍රදේශයේ වී මිලට ගැනීමේ කටයුතු

ආරම්භ කර තිබිණි. එහිදී වී කිලෝග්රෑමයක් රුපියල් 15.00 බැගින් මිලට ගැනීම සිදුවූ නමුත්, පෞද්ගලික අංශයේ වී මිලට ගන්නන් වී සඳහා ගෙවූ මුදල් හිඟුරක්ගොඩ ප්‍රදේශයේදී රු. 10.00-12.00 අතර විය. මනම්පිටිය, අසේලපුර ප්‍රදේශයේ එම මිල රු. 9.00-10.00 අතර විය. මැදිරිගිරිය බේබියාවැව ප්‍රදේශයේ එම මුදල රු. 9.00-11.00 අතර වූ බව නිරීක්ෂණවලින් මෙන්ම ගොවීන්ගෙන් ද අනාවරණය විය. මෙහිදී මනම්පිටිය සහ මැදිරිගිය (බේබියාවැව) ගොවිජන සේවා බල ප්‍රදේශයන්හි වී රජය විසින් අපේක්ෂිත ප්‍රමිතියේ නොවූ බව ගොවීන් මෙන්ම වෙළෙඳුන් රජයේ නිලධාරීන් විසින් ද අනාවණය කෙරිණි. රජය මගින් වී මිලට ගැනීම මෙම ප්‍රදේශවල වී මිල ඉහළයාම සඳහා සිදු කර තිබුනේ සුළු බලපෑමකි. වී මිලට ගැනීමේ රාජ්‍ය වැඩසටහන මෙම ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වූයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා වන අතර එක් වී මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් ග්‍රාම නිලධාරී කොට්ඨාස දෙකක් හෝ තුනක් අවම වශයෙන් ආවරණය කෙරිණි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස වර්ග ප්‍රමාණයෙන් සැළකිය යුතු ප්‍රදේශයක් පුරා ව්‍යාප්තව පවතින අතර ඉහත සඳහන් කළ ප්‍රදේශ මාර්ග, ප්‍රවාහන මෙන්ම සන්නිවේදන අංශයන්ගෙන් ද දැඩි දුෂ්කරතාවන් පවතින ප්‍රදේශ වේ. මෙකී තත්ත්වය මත නාගරික ප්‍රදේශවල එදිනෙද වී මිල පිළිබඳව මෙම ප්‍රදේශවලට වාර්තා නොවූ තරම්ය. එමෙන්ම ප්‍රවාහන සහ මාර්ග දුෂ්කරතා හේතුවෙන් මෙවැනි ප්‍රදේශවලට පැමිණෙන වෙළඳුන් සංඛ්‍යාව ඉතාම සීමිතය. අනෙක් අතට ගොවිජන සේවා හරහා වී මිලට ගැනීමේදී ප්‍රමිතියෙන් තොර වී ප්‍රතික්ෂේප කිරීමත්, ලැබෙන සීමිත මුදල් ප්‍රමාණයට සරිලන ප්‍රමාණය පමණක් මිලදී ගැනීමත් නිසා මෙවැනි දුෂ්කර ප්‍රදේශවල බොහෝ ගොවීන්ට පෞද්ගලික අංශයට අඩු මිලකට වී අලෙවි කිරීමට සිදු වී ඇත.

මේ අන්දමට වී සඳහා අඩු මිලක් ලැබුණ ද, පොළොන්නරු දිස්ත්‍රික්කය තුළ රජය වී මිලට ගත් රු. 15.00 ට වඩා වැඩි මිලක් ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු වී සඳහා පෞද්ගලික අංශය විසින් ගෙවනු ලැබීය. එය රුපියල් 15.00-16.00 අතර විය. රාජ්‍ය අංශය විසින් කෘ.ප.නි.ස. වරුන් හරහා ප්‍රාදේශීයව වී මිලට ගැනීමට ඉදිරිපත් වීම තුළ ඇතිවූ තරඟකාරිත්වය එයට එක් හේතුවක් විය.

ගබඩාකරණ පහසුකම් නොවීම හෝ වෙනත් හේතුන් නිසා වී ගබඩා කර තබා ගැනීමට නොහැකිවීම ද ගොවීන්ට වී සඳහා ලැබෙන මිල පහළ යාමට හේතු වී ඇත. ඉහළ මිලක් බලාපොරොත්තුවෙන් වී ගබඩා කරනුයේ ගොවීන්ගෙන් 29%ක් පමණ වන අතර වී ගබඩා කිරීම සඳහා නිශ්චිත ගබඩා පහසුකම් පවතින්නේ ගොවීන්ගෙන් 12%ට පමණි. ගොවීන්ගෙන් 66%ක් අස්වනු නෙළූ විගසම අලෙවි කරන අතර 15%ක් අස්වනු නෙළා මාස දෙකක් ඇතුළත වී අලෙවි කරනු ලබයි. අස්වනු නෙළා මාස තුනකට වැඩි කාලයක් තබා ගන්නේ ගොවීන්ගෙන් 2%ක් පමණි.

රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී වී නිෂ්පාදනය, ප්‍රවාහනය, ශුද්ධ කිරීම ආදී සියළු කාර්යයන්ට වැයවන මිලට සාපේක්ෂව ලැබෙන මුදලෙහි ලාභය අඩු බව පවසන ගොවීන්ගේ ප්‍රතිශතය 5.6%කි. රාජ්‍ය අංශයට අවශ්‍ය යැයි සැළකෙන ගුණාත්මක තත්ත්වයේ වී එයට වැඩි මිලකට පුද්ගලික අංශයට අලෙවි කළ හැකි බව ඔවුන්ගේ අදහසයි.

**ගුණාත්මක තත්ත්වය**

ප්‍රමිතියෙන් යුතු සහල් සඳහා වෙළඳපොලේ ඉහළ ඉල්ලුමක් මෙන්ම මිලක් ද පවතී. ගුණාත්මක තත්ත්වයෙන් උසස් සහල් නිෂ්පාදනයට ගුණාත්මක තත්ත්වයෙන් යුතු වී අවශ්‍ය වන අතර එහිදී ගුණාත්මක තත්ත්වය සඳහා බොල් ප්‍රමාණය අඩුවීම, නියමිත ප්‍රමාණයට වියළී තිබීම, ගල්වැලි රහිත වීම ආදී සාධක සළකා බැලේ. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී සම්බන්ධව නිරන්තරයෙන් එල්ලවන චෝදනාවක් වන්නේ, එම ප්‍රදේශයේ වී අඩු ගුණාත්මක තත්ත්වයෙන් යුතු බවයි. අස්වනු පැගීමේදී පඩංගු භාවිතා නොකර කමතේ වී පැගීම නිසා වීවලට ගල්, වැලි මුසුවීම මෙම ප්‍රදේශයේ සුලභ සිදුවීමකි. මේ සඳහා රාජ්‍ය අංශය විසින් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා ගොවි සංවිධානවලට පඩංගු ලබාදීම සිදුවෙමින් පැවති අතර ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ද අරඹා තිබිණි. එසේ වුවද ගොවීන් තවදුරටත් සාම්ප්‍රදායික ක්‍රමයට පඩංගු භාවිතයෙන් තොරව කමත තුළ ගොයම් පැගීම නිසා ගුණාත්මක තත්ත්වය පිළිබඳ ගැටළුව දිගින් දිගටම ඉදිරිපත් වේ.

රාජ්‍ය අංශයට වී අලෙවි කරන ගොවීන් ගුණාත්මක තත්ත්වය දැඩිව පරීක්ෂා කිරීමේ ගැටළුවට බෙහෙවින් මුහුණ දෙනු ලබයි. අධ්‍යයනයට ලක්වූ ගොවීන්ගෙන් 86% (430) ට මෙම ගැටළුව බලපා ඇති අතර මනම්පිටිය ප්‍රදේශයේදි 96% තරම් ඉහළ අගයක් ගනී. ගොවීන් මෙහිදී ප්‍රධාන වශයෙන් කරුණු දෙකක් යටතේ අදහස් ඉදිරිපත් කරනු ලබයි. එනම්,

i. කිහිපවතාවක් වී පිරිසිදු කිරීමට සිදුවීම
ii. දැඩිව පරීක්ෂා කිරීමෙන් අනතුරුව වුව ද නියමිත ප්‍රමිතියේ පවතින වී පවා ප්‍රතික්ෂේප කිරීම

ගොවීන් සමඟ සිදුකරනු ලැබූ සාකච්ඡාවන්හි දී අනාවරණය වූ පරිදි නියමිත පරිදි පිරිසිදු කර රැගෙන යන වී තොග වුව ද නැවත බොල් ඉවත් කිරීමට සහ සල්ලඩ් කිරීමට (ගල් ඉවත් කිරීමට) නිලධාරීන් විසින් උපදෙස් දීම බොහෝවිට සිදුවේ. එසේ බොල්, ගල් ඉවත් කර නියමිත ප්‍රමිතියට ඉදිරිපත් කරනු ලැබුව ද ගබඩා පහසුකම් මදිවීම, මුදල් ප්‍රමාණවත් නොවීම යන හේතූන් මත වී තොග ප්‍රතික්ෂේප කිරීම විවිධ අවස්ථාවල සිදුවී ඇත. ගොවීන්ගෙන් 65.2%ක් රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී කිහිපවරක් වී ශුද්ධ කිරීමට සිදුවීම තම ගැටළුව ලෙස

සඳහන් කර ඇති අතර 17.6% ක් වීවල ගුණාත්මක තත්ත්වය දැඩිව පරීක්ෂා කිරීම තම ගැටළුව ලෙස ඉදිරිපත් කරනු ලබයි.

අනෙකුත් ප්‍රදේශ සමඟ සාපේක්ෂව බැලීමේදී මනම්පිටිය ප්‍රදේශයේ (එගොඩපත්තුව) සහ මැදිරිගිරිය බේබියාවැව ප්‍රදේශයේ වී සඳහා ලැබෙන මිල අඩු මට්ටමක පැවතීමට එහි වීවල අඩු ගුණාත්මක තත්ත්වය ද දැඩිව බලපා ඇත. ගොවීන් සමඟ සිදුකරන ලද අවිධිමත් සාකච්ඡාවලදී අනාවරණය වූ පරිදි අඩු ගුණාත්මක තත්ත්වයේ වී නිෂ්පාදනයට බලපානු ලබන සාධක කිහිපයකි. එනම්,

i. වැලි සහිත පසක්වීම
ii. ජලයෙහි කිවුල් ස්වභාවයක් තිබීම
iii. වගාවන් සඳහා නිසි කලට ජලය නොලැබීම සහ ලැබෙන ජලය ප්‍රමාණවත් නොවීම
iv. තාක්ෂණික දැනුම හිඟකම
v. නව බීජ වර්ග හඳුන්වා නොදීම

ඉහත i සිට iii දක්වා වූ හේතුවල බලපෑමෙන් වී කළු පුල්ලි සහිත දිලීර රෝගයට බඳුන්වීම, වීවල වර්ණය අවපැහැවීම, අසම්පූර්ණ වී ඇට නිෂ්පාදනය වීම සිදුවන බවත්, එම නිසා එම ප්‍රදේශවල වී ඉහළ මිලකට අලෙවි කළ නොහැකි බවත් හෙළි විය.

වීවල අඩු ගුණාත්මක තත්ත්වය නිසා ලබාදෙන මුදලින් කිලෝග්‍රෑමයට මුදලක් අඩු කිරීම හෝ වීවල බරෙන් කිසියම් ප්‍රමාණයක් අඩු කිරීම පෞද්ගලික ව්‍යාපාරිකයන්ට වී අලෙවි කිරීමේදී තමන් මුහුණදෙන ගැටළුවක් වශයෙන් සමස්ත නියැදියෙන් 40% ක් සඳහන් කර ඇත. නියැදියෙන් 35% ක් වීවල තෙත ගතිය වැඩිවීම නිසා තමන්ට අඩු මුදලක් ලැබෙන බව සඳහන් කරනු ලබයි. පඩංගු භාවිතා නොකර ගොයම් පෑගීමේදී වී සමඟ ගල්, වැලි මුසුවීම නිසා කි.ග්‍රෑ 65 ක වී මල්ලකින් කිලෝග්‍රෑම් එකකට වැඩි බරක් අඩු කර ගන්නා බව ගොවීන්ගෙන් 01% ක් සඳහන් කර ඇති අතර වී මල්ලකින් කිලෝ ග්‍රෑම් එකක් දක්වා බර අඩු කරන බව ගොවීන්ගෙන් 04% ක් සඳහන් කර ඇත. මනම්පිටිය සහ මැදිරිගිරිය ගොවිජන සේවා බලප්‍රදේශයේ බේබියාවැව ප්‍රදේශය මෙම ගැටළුවට විශේෂයෙන් මුහුණදෙනු ලබයි. මෙයට අමතරව ඉහත සඳහන් කළ ප්‍රදේශ දෙකෙහි වීවල අව පැහැය, වී ඇට සම්පූර්ණ වී නොතිබීම, කළු පුල්ලි රෝගය වැළදීම ආදිය නිසා වීවල ගුණාත්මක තත්ත්වය අඩුවන හෙයින් එම වී කිලෝ ග්‍රෑමයක් සඳහා ලැබෙනුයේ රජය විසින් වී මිලදී ගන්නා මිලට වඩා රු.2.00-3.00 අතර අඩු මිලකි.

රාජ්‍ය අංශයට වී අලෙවියේදී වී වල වියළි බර ලෙස සලකා වී මල්ලක බරෙන් කිසියම් ප්‍රමාණයක් අඩු කිරීම තමන් මුහුණපාන ගැටළුවක් ලෙසින් 22.2% ක්

සඳහන් කරනු ලබන අතර පෞද්ගලික අංශයේදී එම ප්‍රමාණය 4.4%කි. රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී 14.2ක්ද පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී 2.8% ක් ද වියලි බර සඳහා අඩු කරන වී ප්‍රමාණය කිලෝග්‍රෑම් 65 ක වී මල්ලකට කිලෝ ග්‍රෑම් 01 ක් හෝ එයට අඩු ප්‍රමාණයක් වන බව සඳහන් කර ඇත. ගොවීන්ගෙන් 7.2%ක් පවසන්නේ ඒ සඳහා අඩු කරන ප්‍රමාණය කිලෝග්‍රෑම් 65 ක මිටියකට කිලෝග්‍රෑම් 01 ට වඩා වැඩිවන බවයි.

ඉහත කරුණු අනුව පෙනී යන්නේ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී සඳහා අඩු මිලක් ලැබීම සඳහා අඩු ගුණාත්මක තත්ත්වය ප්‍රධාන සාධකයක් වන බවයි. එසේ වුවද මෙම තත්ත්වය බොහෝ දුරට මඟ හරවා ගතහැක්කක් වන අතර මේ සඳහා ගොවීන් දැනුවත් කිරීම මෙන්ම ඒ සඳහා  කිසියම් පෙළඹවීමක් ඇති කිරීම ද කළ යුතුව ඇත. මේ වන විට ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇතැම් පෞද්ගලික වෙළෙඳුන් උසස් ප්‍රමිතියෙන් යුතු වී නිෂ්පාදනයට ගොවීන් පොළඹවා ඇති අතර එවැනි වී සඳහා රජය ගෙවන මුදලට වඩා වැඩි මුදලක් ගෙවා මිලට ගැනීමට එම ව්‍යාපාරිකයින් කටයුතු කරන බව ද අනාවරණය විය.

**අක්‍රමිකතා සහ වංචනික ක්‍රියා**

පුද්ගලික අංශයට මෙන්ම රාජ්‍ය අංශයට ද වී අලෙවි කිරීමේදී විවිධ අක්‍රමිකතා, වංචනික ක්‍රියාවන්ට මුහුණ දීමට සිදුවී ඇත. අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගේ 25% ආසන්න සංඛ්‍යාවක් සඳහන් කරනුයේ, රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන් වී මිලට ගැනීමේ නිරත නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ විවිධ අකටයුතුකම් සහ අකාර්යක්ෂමතාවන්ට මුහුණදෙනු ලබන බවයි. නිලධාරීන්ට අල්ලස්දීමට සිදුවීම (10.6%), නිලධාරීන් තම පුද්ගලික හිතවත්කම් මත වී මිලට ගැනීම (8.4%), නිලධාරීන්ගේ අකාර්‍යක්ෂමතාව (2.6%), වංචනික ආකාරයෙන් වී මැණීම (0.6%), වී මළු සොරකම් කිරීම (0.2) මෙම අක්‍රමිකතා වශයෙන් සඳහන් කර ඇත. තම වී අලෙවිකර ගැනීම සඳහා රු.200/- සිට 1500/- අතර මිලක් නිලධාරීන්ට සහ සේවකයන්ට අල්ලස් වශයෙන් දීමට සිදුවන බව ගොවීන්ගෙන් 10.6% ක් අනාවරණය කරනු ලබයි. විශේෂයෙන්ම මෙම චෝදනාව එල්ල කරනුයේ සමුපාකාර සමිති සම්බන්ධයෙනි. පුද්ගලික හිතවත්කම් මත වී මිලට ගැනීම මෙන්ම ගොවීන්ගේ වී මිලට ගැනීමට වඩා පෞද්ගලික අංශයේ වී එකතු කිරීමේ නිරත ව්‍යාපාරිකයන්ගේ වී මිලට ගැනීමට රාජ්‍ය අංශයේ නිලධාරීන් ප්‍රමුඛතාව දෙනු ලබන බවත්,  එම වීවල ගුණාත්මක තත්ත්වය සැලකිල්ලට නොගන්නා බවත් තම අත්දැකීම් ආශ්‍රයෙන් ගොවීන් සඳහන් කරනු ලබයි. එමෙන්ම වී අස්වනු නෙළන සමය ආරම්භවීමත් සමඟ වී මිලට ගැනීමට කටයුතු නොකිරීම ද රාජ්‍ය නිලධාරීන්ගේ ආකර්යක්ෂමතාවක් ලෙස ගොවීහු පෙන්වා දෙති.

රජය මඟින් වී මිලට ගැනීම තුළින් වී මිල ඉහළ නැංවීමට නොයෙක් වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇතත් එම වැඩසටහන් ක්‍රියාත්මක වීමේ ප්‍රමාදය මත වී

අලෙවි ගැටළුව සඳහා නිසි පිළියම් යෙදී නොමැති බව හැඟේ. අනෙක් අතට නිළධාරීන්ට අල්ලස් දීමට සිදුවීම හා තම පුද්ගලික හිතවත්කම් මත නිළධාරීන් වී මිලට ගැනීම යන කරුණු කෙරෙහි ද රජයේ අවධානය යොමුවිය යුතුව පවතී. නිලධාරීන්ගේ අකාර්යක්‍ෂමතාව පිළිබඳ ගොවීන් මෙහිදී සඳහන් කර ඇත. එනමුත් දනට වී මිලට ගැනීම සිදු කරන ආයතන තම එදිනෙදා කාර්යයන්ට අමතර කාර්යයක් ලෙසින් වී මිලදී ගැනීමේ නිරතවන හෙයින් ඔවුන්ගේ සීමිත කාර්ය මණ්ඩල මේ සඳහා යොදවා ගැනීමේදී ගැටළු මතුවීම මත ඉහත කී අන්දමේ තත්ත්වයක් ඇති විය හැක.

පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන්ගෙන් 13% ආසන්න ප්‍රමාණයක් වංචනික කිරුම්, මිණුම් භාවිතය පිළිබඳ ගැටළුවට මුහුණ දී ඇත. මනම්පිටිය ප්‍රදේශයේදී මෙය 29% තරම් ඉහළ අගයක් ගෙන ඇත. වංචනික කිරුම්, මිණුම් සිදුවන ආකාරයන් ලෙස ගොවීන් ක්‍රම කිහිපයක් අනාවරණය කරනු ලබයි. එනම්,

- තරාදියේ ඊයම් කොටස් ඉවත් කිරීම.
- වැඩි වී ප්‍රමාණයක් අඩු බරක් ලෙස අඟවා මැනීම.
- වී මල්ලක බරෙන් කිලෝග්රෑම් එකක් අඩු කිරීම.
- තරාදියේ (දුණු කොටස්) වෙනස් කිරීම, බ්ලේඩ් වැනි ද්‍රව්‍ය තැබීමෙන් මිණුම්වල වෙනස්කම් ඇති කිරීමෙන් වැඩි බරක් අඩු බරක් ලෙස තහවුරු කරමින් වී මැණීමයි.

වංචනික කිරුම්, මිණුම් භාවිතා කිරීම තම ගැටළුවක් ලෙස සඳහන් කර ඇති ගොවීන්ගෙන් 75.7% ක්, වී මැනීමේදී ව්‍යාපාරිකයන් විවිධ ක්‍රම භාවිතා කරමින් තරාදියේ දිස්වන බරට වඩා වැඩි වී ප්‍රමාණයක් එම බර යටතේ කිරන බව සඳහන් කර ඇත. මේ ආකාරයට ගොවීන්ගෙන් වංචනිකව ලබා ගන්නා වී ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 65 වී මල්ලකින් ග්රෑම් 500 සිට කිලෝ ග්රෑම් 5 ක් පමණ දක්වා පරාසයක පැතිර පවතින බව අනාවරණය විය.

**මිලදී ගැනීමේ අකාර්යක්‍ෂමතා**

රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන් විවිධ අකාර්යක්‍ෂමතාවන්ට මුහුණ දෙනු ලබන බව ගොවීන් විසින් පෙන්වා දී ඇත. ගොවීන්ගෙන් 48% (240) ක්, මිලදී ගන්නා ස්ථානයේදී තම වී අලෙවි කර ගැනීමේ ප්‍රමාදයන්ට මුහුණදෙනු ලබයි. ගොවීන්ගෙන් 32.2% (161) ක් දිනක් හෝ එයට වැඩි කාලයක් ඒ සඳහා පෝලිම්වල සිටීමට සිදුවන බව සඳහන් කරනු ලබයි. දින කිහිපයක් වී අලෙවිකර ගැනීමට ප්‍රමාදවන බව හෙළි කළ ප්‍රතිශතය සමස්ත නියැදියෙන් 26.8.%ක් වේ. දින 2-5 අතර කාලයක් ඒ සඳහා වැයවන බව ඔවුන් සඳහන් කරනු ලබයි. පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන් මෙම ගැටළුවට මුහුණ නොදෙන අතර ව්‍යාපාරිකයන් නිවසට හෝ කමතට පැමිණ වී මිලට ගැනීම එයට හේතු වී ඇත.

ගොවීන්ගෙන් 66.2% (331) ක් රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන්ට මුදල් ලැබීමට ප්‍රමාදවීම ගැටළුවක් ලෙසින් ඉදිරිපත් කරනු ලබයි. මේ ආකාරයට මුදල් ලැබීම ප්‍රමාදවීමේ කාලසීමාව සතියක සිට මාස 3ක් පමණ දක්වා වේ. තම මුදල් ලැබීමට සතියක් ප්‍රමාද වන බව ගොවීන්ගෙන් 12%ක් ද සති දෙකක් දක්වා ප්‍රමාද වනබව 10.4%ක් ද, මාසයක් දක්වා ප්‍රමාද වන බව 19%ක් ද, මාසයත් මාස තුනත් අතර කාලයක් ප්‍රමාද වන බව 09%ක් ද සඳහන් කරනු ලබයි. මුදල් ප්‍රමාදයට අමතරව චෙක්පත්වලින් මුදල් ගෙවීම නිසා ඒවා බැංකු ගිණුමට බැර කිරීමට සිදුවීම සහ ඒ වෙනුවෙන් කිහිපවතාවක් ගමනාගමනයේ යෙදීමට සිදුවීම, බැංකු විසින් චෙක්පත්වලින් බැංකු කටයුතුවල යෙදීම වෙනුවෙන් කිසියම් මුදලක් අඩු කරගෙන ගොවියාට මුදල් ලබාදීම මේ සම්බන්ධ අනෙකුත් ගැටළු වේ.

පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී මුදල් ලබා ගැනීමේ ප්‍රමාදයන් ඇති බව සමස්ත නියැදියෙන් 1.6%ක් සඳහන් කර ඇත. මෙහිදී මුදල් වාරික වශයෙන් ගෙවීම, කෘමි නාශක, පොහොර, බිත්තර වී ආදී විවිධ ණය සඳහා වූ මුදල් අය කරගෙන ඉතිරි මුදල් පසුව ගෙවීම මෙයට සම්බන්ධ කරුණු වශයෙන් සඳහන් කර ඇත. ගොවීන්ට වී සඳහා ලැබෙන මුදල අඩු මට්ටමක පැවතීමට බලපානු ලබන ප්‍රධාන සාධකයක් වන්නේ මේ ආකාරයට කෘෂි යෙදවුම් වෙළෙන්ද වෙත පවතින ණයගැති භාවයයි. ඇතැම් විට ඉහළ මිලක් තම වී සඳහා ලබාගැනීමේ ශක්‍යතාවක් පැවතිය ද ගොවියා ණය ගැතියෙකු වීම නිසා එම අවස්ථාව මඟ හැරේ.

## ප්‍රධාන වෙළෙඳුන් කිහිප දෙනෙකු විසින් වෙළෙඳපොළ හැසිරවීම

ප්‍රධාන වෙළෙඳුන් කිහිපදෙනෙකු විසින් වෙළෙඳපොළ හැසිරවීම නිසා වී මිල ඔවුන් විසින් තීරණය කරනු ලබන බවත් වී අලෙවියේදී ලැබෙන මිල පහළ මට්ටමක පැවතීමට එය හේතුවක් වන බවත් ගොවීන්ගෙන් 25% කට ආසන්න ප්‍රමාණයක් සඳහන් කරනු ලබයි. විවිධ ආකාරයේ තර්ජනය කිරීම් මඟින් පිටතින් පැමිණෙන වෙළඳුන්ගේ පැමිණීම වැළැක්වීම (14.8%), ව්‍යාපාරිකයා විසින් වී මිල තීරණය කිරීම (57.4%), වංචනික කිරුම්, මිණුම් ක්‍රම භාවිතය (1.6%) රජයේ විශේෂිත මිලට වඩා අඩුවෙන් ගෙවීම (3.3%), මෙම තත්ත්වයට අදාළ ගැටළු ලෙසින් ගොවීන් ඉදිරිපත් කර ඇත.

තම වී අලෙවියේදී ව්‍යාපාරිකයා මිල තීරණය කරන බව හෙළි කළ ප්‍රතිශතය 97% කි. ප්‍රදේශයේ වී මිල තීරණය කිරීම ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරිකයන් කිහිපදෙනෙකු විසින් පාලනය කරන බව ප්‍රදේශයේ ගොවීන් සමඟ මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සහ ව්‍යාපාරිකයන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවලදී අනාවරණය විය. මෙම හේතුවලට අමතරව වී මිල සම්බන්ධව පාලනයක් පවත්වා ගැනීමට ප්‍රදේශයේ ව්‍යාපාරිකයන්ට හැකියාව ලැබී ඇති තවත් ප්‍රධාන

මාර්ගයක් වන්නේ පිටතින්, විශේෂයෙන් මරදගහමුල ප්‍රදේශයෙන් පැමිණෙන වී මිලට ගන්නා ව්‍යාපාරිකයන් විවිධ තර්ජනාත්මක ක්‍රියා මාර්ග මගින් ප්‍රදේශයට පැමිණීම වැළැක්වීමයි. ගොවීන් පෙන්වාදෙන අන්දමට මරදගහමුල ප්‍රදේශයෙන් ලොරි පැමිණීමේදී ප්‍රදේශයේ පවතින මිලට වඩා කිසියම් වැඩි මිලකට වී අලෙවි කිරීමේ අවස්ථාව ගොවීන්ට හිමිවුව ද වර්තමානයේ සංවිධානාත්මක පිරිස් විසින් වෙනත් ප්‍රදේශවලින් වී මිලට ගන්නා ලොරි පොළොන්නරුව ප්‍රදේශයට පැමිණීම වැළැක්වීම නිසා එම අවස්ථාව ඔවුන්ට අහිමි වී ඇත.

මේ හා සමාන තත්ත්වයකට රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන්ට මුහුණ දීමට සිදුවන බව ගොවීන් විසින් සඳහන් කරනු ලබයි. එනම් රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන් මුහුණදෙන ගැටළුව ලෙස සීමිත වී ප්‍රමාණයක් මිලට ගැනීම සම්බන්ධව ගොවීන්ගෙන් 3.6% ක් සඳහන් කරන අතර සීමිත පිරිසකගේ වී පමණක් මිලට ගැනීම සහ තමන් සතු සියළුම වී මිලට නොගැනීම යන කරුණු දෙකම මෙයට ඇතුළත් වේ. රජය ගොවි සංවිධාන හෝ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා වී මිලට ගැනීමේදී ගොවි සංවිධානයේ හෝ ගොවිජන බැංකුවේ සාමාජිකයන්ගේ වී පමණක් මිලට ගන්නා බවත්, අඳයට හෝ වී බද්දට කුඹුරු කරන පුද්ගලයින්ට මේ යටතේ වී අලෙවි කිරීමට අවස්ථාව නොලැබෙන බවත් ගොවීන් විසින් අනාවරණය කෙරුණි.

මෙයට අමතරව ගොවීන්ගෙන් 6.4%ක් රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී තමන් මුහුණදෙන ගැටළුවක් ලෙස රාජ්‍ය අංශයේ වී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන නොතිබීම හඳුනාගෙන ඇත. ඇලහැර බකමූණ, මැදිරිගිරිය සහ මනම්පිටිය මෙම ප්‍රශ්නයට මුහුණ දී ඇති වැඩි පිරිසක් නියෝජනය කරන ප්‍රදේශ වේ. උප නගර ආශ්‍රිතව වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන පිහිටියත් එම මධ්‍යස්ථානවලට ඇති දුර ප්‍රමාණය වැඩිවීම ගොවීන් මුහුණදෙන ගැටළුවකි. හිඟුරක්ගොඩ ප්‍රදේශයේ ගොවීන් මෙම ගැටළුව පිළිබඳ සඳහන් නොකිරීම විශේෂත්වයකි.

## වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළු සඳහා ඔවුන් ඉදිරිපත් කළ යෝජනා

වී අලෙවි කිරීමේදී ගොවීන් මුහුණ දෙන ගැටළුවලට විසඳුම් ලෙස ඉදිරිපත් කළ යෝජනා වගු සටහන් අංක 04න් ඉදිරිපත් කෙරේ. වී මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් සහිත රජයේ මධ්‍යස්ථාන පිහිටුවීම, සහතික මිලක් නියම කිරීම, ජංගම වෙළඳසැල් ආරම්භ කිරීම, රාජ්‍ය අංශයේ මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, වංචනික කටයුතුවලට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීම, රජයේ සහල් සැකසුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම, පෞද්ගලික අංශයේ ඒකාධිකාරය බිඳහෙළීම මෙම යෝජනා අතර ප්‍රමුඛ වේ.

**වගු සටහන් අංක 04: වී අලෙවියේදී ගොවීන් මුහුණදෙන ගැටළු සඳහා ඔවුන් ඉදිරිපත් කළ යෝජනා**

| යෝජනා | ගොවිජන සේවා බලප්‍රදේශය (%) | | | | | සමස්ත |
|---|---|---|---|---|---|---|
| | හිගුරක්ගොඩ n=100 | මනම්පිටිය n=100 | මැදිරිගිරිය n=100 | සේවාගම n=100 | ඇලහැර/ බකමූන n=100 | නියැදිය % n=500 |
| ප්‍රමාණවත් ගබඩා පහසුකම් සහිත රජයේ වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීම | 27.0 | 56.0 | 57.0 | 30.0 | 57.0 | 45.4 |
| රු.13.00-15.00 අතර සහතික මිලකට වී ගැනීම | 11.0 | 3.0 | 2.0 | 4.0 | 0.0 | 4.0 |
| රු.15.00-18.00 අතර සහතික මිලකට වී ගැනීම | 76.0 | 73.0 | 92.0 | 60.0 | 63.0 | 72.8 |
| රු.18.00 ට වැඩි සහතික මිලකට වී ගැනීම | 14.0 | 10.0 | 9.0 | 24.0 | 13.0 | 14.0 |
| නිෂ්පාදන යෙදවුම් මිල අඩු කිරීම | 10.0 | 9.0 | 7.0 | 14.0 | 36.0 | 15.2 |
| අලෙවි මධ්‍යස්ථාන දක්වා ප්‍රවාහන පහසුකම් සැපයීම | 0.0 | 1.0 | 3.0 | 1.0 | 0.0 | 1.0 |
| රජයේ වී මිලදී ගන්නා ස්ථාන -යේදීම මුදල් ගෙවීම | 22.0 | 11.0 | 16.0 | 16.0 | 10.0 | 15.0 |
| ගුණාත්මක බව දැඩිව පරීක්ෂා නොකිරීම | 14.0 | 6.0 | 5.0 | 9.0 | 11.0 | 9.0 |
| රාජ්‍ය නිලධාරින්ගේ අක්‍රමිකතා වැළැක්වීම/කාර්යක්ෂමතාව ඉහළ නැංවීම | 47.0 | 30.0 | 30.0 | 37.0 | 3.0 | 29.4 |
| රජයේ සහතික මිලට වී නොගන්නා පිරිස්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම | 8.0 | 3.0 | 2.0 | 4.0 | 0.0 | 3.4 |
| වී කි.ග්‍රෑ. 65 මල්ලකින් කපා හරින වී ප්‍රමාණය අඩු කිරීම | 2.0 | 0.0 | 1.0 | 3.0 | 0.0 | 1.2 |
| දිගු කාලයක් පාවිච්චි කළ හැකි ඇසුරුම් මළු වෙළඳපලට නිකුත් කිරීම | 13.0 | 3.0 | 2.0 | 12.0 | 0.0 | 6.0 |
| වී ගබඩා කර තබා ගැනීමට රජය විසින් ගොවීන්ට මූල්‍ය පහසුකම් සැපයීම | 3.0 | 3.0 | 3.0 | 5.0 | 2.0 | 3.2 |
| රාජ්‍ය අංශයෙන් ක්‍රියාත්මක කරන සහල් සැකසීමේ මධ්‍යස්ථා ආරම්භ කිරීම | 5.0 | 5.0 | 9.0 | 5.0 | 6.0 | 6.0 |
| ජංගම වෙළඳ සේවාවන් ආරම්භ කිරීම | 13.0 | 6.0 | 11.0 | 15.0 | 7.0 | 10.4 |
| පෞද්ගලික අංශයේ ඒකාධිකාරය බිඳ හෙළීම | 3.0 | 8.0 | 1.0 | 6.0 | 8.0 | 5.2 |

**මූලාශ්‍ර : පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය 2006 හෙ.කො.ගො.ප.පු. ආයතනය**

වගු සටහන් අංක 04න් ඉදිරිපත් කෙරෙන යෝජනා අතර ගොවීන්ගෙන් 91% ට ආසන්න පිරිසක් යෝජනා කර ඇත්තේ තම වී සඳහා රජය මඟින් සහතික මිලක් නියම කළයුතු බවයි. මෙම සහතික මිල කාණ්ඩ තුනක් යටතේ ගොවීන් ඉදිරිපත් කර ඇත. වී කිලෝ ග්‍රෑමයක් රු. 13.00-15.00 අතර මිලකට රජය විසින් මිලට

ගැනීම කළයුතු බව ගොවීන්ගෙන් 4.0% අදහස් දක්වා තිබූ අතර එවැනි මිලකට වී ගැනීමේදී යෙදවුම් සඳහා වන මිල (විශේෂයෙන්ම පොහොර සහ කෘෂි රසායනික) අඩු කළයුතු බවට අදහස් ඉදිරිපත් විය. මේ වන විට රජය විසින් වී වගාව සඳහා රු.350/- සහන මිලට ගොවීන් වෙත පොහොර ලබාදීම සිදු කරන හෙයින් ගොවීන්ගේ ඉහත ඉල්ලීම ඉටුවී ඇත. කෙසේ වුවද, ගොවීන්ගේ වී නිෂ්පාදන මිල ඉහළ යාම සඳහා පොහොර මිල පමණක් නොව ප්‍රායෝගික තත්ත්වය සළකා බලන විට ඔවුන් විසින් බොහෝ විට අවශ්‍ය ප්‍රමාණයට වඩා පොහොර යෙදීමත් කෘෂි රසායනික වෙළෙඳුන්ගේ අදහස්වලට හෝ තම හිතුමනාපයට අනවශ්‍ය පරිදි කෘෂි රසායනික ද්‍රව්‍ය වගාවට යෙදීමත් හේතු වී ඇත. එම තත්ත්වයන් වළක්වා ගැනීමෙන් නිෂ්පාදන වියදම අඩු කර ගැනීමට කිසියම් ප්‍රමාණයකින් ඉඩ ප්‍රස්ථාව සැළසෙනු ඇත. 2004 මහ කන්නයේ අස්වනු සඳහා පොහොර සහ වෙනත් යෙදවුම් සඳහා වැය කළ මුදල සැලකිල්ලට ගනිමින් රු. 15.00-18.00 අතර සහතික මිලක් වී කිලෝග්‍රෑම් එකකට තිබිය යුතු බව ගොවීන්ගෙන් 72.8% ක් සඳහන් කරනු ලැබීය. ගොවීන්ගෙන් 14%ක් ප්‍රකාශ කරනු ලැබුවේ රු. 18.00 ට වැඩි සහතික මිලක් වී කිලෝග්‍රෑම් එකක් සඳහා ලැබිය යුතු බවයි. එයට හේතු වශයෙන් ඔවුන් පෙන්වා දෙනු ලබන්නේ කෘෂි යෙදවුම් සඳහා වැයවන මිල මෙන්ම ප්‍රවාහන සහ ඇසුරුම් මිල දිනෙන් දින ඉහළ යාමයි. වී කිලෝග්‍රෑම් එකකට ලැබෙන මිල මෙයට වඩා අඩුවන්නේ නම් විශේෂයෙන්ම පොහොර මිල අඩුවිය යුතු බවත් එසේ නොමැතිනම් පහසුවෙන් භාවිතා කළ හැකි මිලෙන් අඩු කාබනික පොහොර රටපුරා ව්‍යාප්ත කළ යුතු බවත් ගොවීන්ගේ අදහසයි.

රජය විසින් වී මිලට ගැනීමේ කාර්යයට සක්‍රීය දායකත්වයක් ලබාදිය යුතු බව ගොවීන්ගේ යෝජනා අතර තවත් ප්‍රධාන යෝජනාවකි. ප්‍රධාන නගරයෙන් එපිට ප්‍රදේශවල මෙම යෝජනාව කරන ප්‍රමාණය ඉහළ ප්‍රතිශතයකි. මනම්පිටිය, මැදිරිගිරිය, ඇලහැර - බකමූණ ප්‍රදේශවල 58%-65% අතර පිරිසක් මෙම අදහස ඉදිරිපත් කරනු ලබති. හිඟුරක්ගොඩ සහ සේවාගම ප්‍රදේශවල මෙම අදහස ඉදිරිපත් කරන ගොවීන් ප්‍රතිශතය පිළිවෙලින් 27.0% සහ 30% බැගින් වේ.

මෙයට අමතරව ගොවීන්ගෙන් 10.4% සඳහන් කරනුයේ වී මිලට ගැනීම සඳහා රජය විසින් ජංගම වෙළඳසැල් ආරම්භ කළයුතු බවයි. මෙම යෝජනා අනුව පැහැදිලි වන්නේ අඩු මාර්ග සහ ප්‍රවාහන පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශවල වී මිලට ගැනීම සඳහා එම ප්‍රදේශ ආශ්‍රිතව වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන හෝ ජංගම වෙළඳසැල් අස්වනු නෙලන සමය ආරම්භ වනවිටම රජය විසින් ආරම්භ කළයුතු බවයි. 2004 මහ කන්නයේදී ගොවිජන සේවා මධ්‍යස්ථාන, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගේ මාර්ගයෙන් ඉතාම පහළ මට්ටමේ සිට වී මිලට ගැනීම ආරම්භ කර තිබුණ ද එය සාර්ථක කර ගැනීමෙහිලා තිබූ එක් අඩුපාඩුවක් ලෙස ගොවීන් සඳහන් කරනුයේ ග්‍රාමීයව වී ගබඩා කිරීමට තරම් පහසුකම් නොවීම හා අවශ්‍ය තරම් මුදල් ප්‍රතිපාදන ලබා නොදීමයි. එම නිසා ඉතා සීමිත පිරිසකගේ, අස්වැන්නෙන් සුළු කොටසක් පමණක් අලෙවි කර

ගැනීමට හැකි වූ නමුත් පොළොන්නරුව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි කොට්ඨාස සැලකිය යුතු තරම් විශාල භූමි ප්‍රදේශයක ව්‍යාප්තව පවතින නිසා එවැනි ග්‍රාම නිලධාරී කොට්ඨාස 2-3 සඳහා එක් මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් බැගින් පිහිටුවීමද එතරම් සාර්ථක පිළියමක් නොවන බවත් ගොවීහු ප්‍රකාශ කරති. ගොවීන් යෝජනා කරනු ලබන්නේ කෘ.ප.නි.ස සහ ගොවි සංවිධානවල සහභාගිත්වයෙන් එක් ග්‍රාම නිලධාරි කොට්ඨශයකට වී මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් බැගින් අස්වනු නෙලීම ආරම්භවීමත් සමගම ආරම්භ කළ යුතු බවයි. එම මධ්‍යස්ථානවල එකතුවන වී තොග රජයේ දැනට වසාදමා ඇති ප්‍රධාන ගබඩා සංකීර්ණවල හෝ වෙනත් ගොඩනැගිලිවල ගබඩා කර තැබීමත්, ඒ අවස්ථාවේ සිටම ඉන් කිසියම් ප්‍රමාණයක් රජයේ සහල් සැකසීමේ මධ්‍යස්ථාන හරහා සහල් බවට පත්කොට බෙදා හැරීම සිදු කිරීමත් තුළින් ගබඩා සංකීර්ණවල ඇතිවන අනවශ්‍ය තදබදය වලක්වා ගැනීමටත් තම වී සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමටත් මාර්ගය සැලසෙන බව ගොවීන්ගේ අදහසයි. මේ ආකාරයේ සක්‍රිය වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන ජාලයක් හරහා දිස්ත්‍රික්කය පුරා වී මිලට ගැනීමේ කාර්යය, දැනට අත්හැර දමා ඇති රාජ්‍ය සම්පත් යොදවා ගනිමින් සිදුකළ හැක.

පෞද්ගලික අංශයට මිල අඩුවෙන් හෝ වී අලෙවි කිරීමට ගොවීන් පෙළඹීමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ අස්වැන්න නෙලීමේදී හා වෙනත් කටයුතු සඳහා වූ ණය ගෙවීමට අවශ්‍යවීමත් එදිනෙද අවශ්‍යතා සඳහා මුදල් ඉක්මණින් අවශ්‍යවීමත්ය. රාජ්‍ය අංශයට වී අලෙවියේදී මුදල් ලබා ගැනීම ප්‍රමාදවීම ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන අතර එයට විසඳුමක් ලෙස ගොවීන් ඉදිරිපත් කරන්නේ වී මිලදී ගන්නා ස්ථානයේදීම (ගොවි සංවිධාන සාමාජිකයන් සහ කෘ.ප.නි.ස. ඇතුළු කමිටුවකින් සමන්විත) වී සඳහා මුදල් ගෙවීමේ ක්‍රමයක් ආරම්භ කළයුතු බවයි. මේ සඳහා ඉදිරිපත් වන තවත් අදහසක් වන්නේ වී මිල ඉහළ යන අවස්ථාවක විකිණීමට, තම වී ඇපයට තබාගෙන රජය මඟින් මුදල් ලබාදිය යුතු බවයි. මෙම අදහස ඉදිරිපත් කළ පිරිස ගොවීන්ගෙන් 3.2% කි. ගොවීන් මෙහිදී යෝජනා කරනු ලබන්නේ අලෙවි සවිය වැඩසටහන යටතේ ලබාදුන් ණය මුදල වැනි ණය මුදලක් නොව තම වී සඳහා මුදලකි. අලෙවි සවිය යටතේ රාජ්‍ය නිලධාරීන් ණය මුදල කෙරෙහි වගකිව යුතු වූ හෙයින් තමන් අවදානමක් දරා ගොවීන්ට ණය මුදල් ලබා දීමට රාජ්‍ය නිලධාරින් එතරම් මනාපයක් නොදක්වූ බවත් ඒ නිසාම එයට විකල්ප ක්‍රියා මාර්ගයක් අවශ්‍ය බවත් ගොවීහු අදහස් කරති.

රාජ්‍ය අංශයේ මැදිහත්වීමෙන් වී මිලට ගැනීමේදී නිලධාරින් සහ සේවකයන් විසින් සිදුකරන අක්‍රමිකතා සහ අල්ලස් ගැනීම නතර කළයුතු බව ගොවීන්ගෙන් 13%කගේ අදහසයි. එමෙන්ම නිලධාරින්ගේ අකාර්යක්ෂමතාව නිසා ගොවීන්ට සිදුවන පාඩු සහ අපහසුතා මගහරවා ගැනීමට නිලධාරින්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම වෙනුවෙන් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළයුතු බව ගොවීන්ගෙන් 15% ක් පෙන්වා දී ඇත.

ඇසුරුම් සම්බන්ධ ගැටළුවට පිළියමක් ලෙස ගොවීන් පෙන්වා දෙනු ලබන්නේ ගුණාත්මක, කල් තබා ගතහැකි ආකාරයේ ඇසුරුම් මළු රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ මැදිහත්වීමෙන් වෙළඳපොලට නිකුත් කළ යුතු බවයි. එමෙන්ම රාජ්‍ය අංශය මැදිහත් වී සහන මිලට ඇසුරුම් මළු ලබාදීම ද මේ සඳහා පිළියමක් ලෙස ගොවීන් විසින් පෙන්වා දෙනු ලබයි.

ප්‍රවාහන ගැටළුවට පිළියමක් ලෙස රාජ්‍ය අංශයේ වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන සෑම ග්‍රාම නිලධාරී කොට්ඨාසයකටම එකක් බැගින් ආරම්භ කිරීමත්, රාජ්‍ය අංශයේ වී මිලට ගැනීමේ ජංගම සේවා ඇති කිරීමත් කළයුතු බව ගොවීහු පෙන්වා දෙති.

## වී මිලට ගැනීමේදී සහ අලෙවියේදී අතරමැදියන් සහ වී මෝල් හිමියන් මුහුණදෙන ගැටළු

වී මිලට ගැනීමේදී වී මෝල් හිමියන් මෙන්ම වී එකතු කිරීමේ නිරත අතරමැදියන් ද පොදුවේ මුහුණ දෙනු ලබන ගැටළු කිහිපයකි. ඒවල ගුණාත්මක තත්ත්වය පහළ මට්ටමක තිබීම, මුදල් හිඟකම, ගබඩා පහසුකම් හිඟකම, වී මිලෙහි අවිනිශ්චිත බව ඒ අතර ප්‍රධාන සාධක වේ. වගු සටහන් අංක 05 න් වී මිලට ගැනීමේ නිතර අතරමැදි ව්‍යාපාරිකයන් හා වී මෝල් හිමියන් වී මිලට ගැනීමේදී මුහුණදෙන ගැටළු ඉදිරිපත් කෙරේ.

**වගු සටහන් අංක 05 : වී මිලට ගැනීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන් / වී මෝල් හිමියන් වී මිලට ගැනීමේදී මුහුණදෙන ගැටළු**

| ගැටළුව | අතරමැදි ව්‍යාපාරිකයන් % (n=38) | වී මෝල් හිමියන් % (n=38) |
|---|---|---|
| ගුණාත්මක තත්ත්වයෙන් අඩු වී මිලට ගැනීමට සිදුවීම | 92.1 | 92.1 |
| මුදල් හිඟකම | 55.3 | 42.1 |
| ගබඩා පහසුකම් හිඟකම | 15.8 | 13.2 |
| තරඟකාරීත්වය | 5.3 | 0.0 |
| ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට අපහසුවීම | 5.3 | 7.9 |
| ගොවීන්ගේ වංචනික ක්‍රියා | 2.6 | 0.0 |
| බැංකු ණය නිසි කලට නොලැබීම | 0.0 | 5.2 |
| වී මිල අවිනිශ්චිතවීම | 5.3 | 13.2 |
| වී සඳහා මුදල් එකවර ගෙවීමට සිදුවීම | 0.0 | 5.3 |
| වී හිඟකම | 0.0 | 2.6 |

**මූලාශ්‍ර: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය 2006 හෙ.කො.ගො.ප.පු. ආයතනය**

## අඩු ගුණාත්මක තත්ත්වයේ වී මිලට ගැනීමට සිදුවීම

මෙයට පෙර සිදුකරන ලද අධ්‍යයන්හිදී ද (සෝමරත්න - 1987) පෙන්වාදී ඇති පරිදි වී මිලට ගැනීමේදී අතරමැදි ව්‍යාපාරිකයින් මෙන්ම වී මෝල් හිමියන් ද මුහුණදෙනු ලබන ප්‍රධානම ගැටළුව වන්නේ ගොවීන් විසින් නිෂ්පාදනය කරනු ලබන වී අඩු ගුණාත්මක තත්ත්වයේ ඒවා වීමයි (වගු සටහන් අංක 05). පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල තවමත් අස්වනු සකස් කරනුයේ, සාම්ප්‍රදායික ක්‍රමයට කමත තුළ වන අතර මනම්පිටිය, මැදිරිගිරිය, ඇලහැර - බකමූණ වැනි ප්‍රදේශවල 100% පාහේ ගොයම් පෑගීම කුඹුරේ අස්වනු කපාගත් ලියැද්දක පඩංගු භාවිතයෙන් තොරව සිදුකරනු ලබයි. මෙහිදී ගල්, වැලි වැනි අපද්‍රව්‍ය මුසුවීම සිදුවන අතර එවැනි වී සඳහා ව්‍යාපාරිකයින් විසින් ගුණාත්මක තත්ත්වයේ පවතින වීවලට සාපේක්ෂව කිලෝග්‍රෑමයක් සඳහා රු.1.00-2.00 අතර මුදලක් අඩුවෙන් ගෙවනු ලබයි. එයට හේතු වන්නේ මෙම වී පිරිසිදු කිරීමට (ගල්,වැලි, බොල් ඉවත් කිරීමට හා තෙත සහිත වී වියලීමට) අමතර වියදමක් දැරීමට සිදුවීමත්, අඩු ගුණාත්මක තත්ත්වයේ වීවලින් ඉහළ ගුණාත්මක තත්ත්වයේ සහල් නිෂ්පාදනය කිරීමට නොහැකි නිසා එම සහල්වලට අඩු මිලක් ලැබීමත්ය. එමෙන්ම අතරමැදි ව්‍යාපාරිකයන් විසින් මෙවැනි වී මිලට ගෙන වී මෝල් හිමියන්ට විකිණීමේදී ඒවා ඉහළ මිලකට විකිණීමට නොහැකිවීමත්, නියමිත ප්‍රමාණයට නොවියලුණු වී කල්තබා ගැනීමේදී වියළීම නිසා බර අඩුවීමෙන් පාඩු සිදුවීමත්, පුස් හට ගැනීමත් ගැටළු ලෙස තවදුරටත් ඉදිරිපත් වේ.

## මුදල් අපහසුතා

වී වෙළඳාමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල් හිමියන් ද මුහුණපාන අනෙක් ප්‍රධාන ගැටළුව ලෙසින් සඳහන් කරනු ලබන්නේ ව්‍යාපාරයට යෙදවීමට අවශ්‍ය තරම් මුදල් නො තිබීමයි. තමන්ගේ මුදල්, නෑ හිතවතුන්ගේ මුදල් මෙන්ම ආයතනික හා ආයතනික නොවන මට්ටමින් ණයට ගනු ලැබූ මුදල් මේ සඳහා යොදවා ඇති බව ව්‍යාපාරිකයන් සමඟ කරන ලද සාකච්ඡාවලදී හෙළිවිය. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාරිකයන් මෙන්ම වී මෝල්හිමියන් ද ණය ලබාගෙන ව්‍යාපාරය සඳහා යෙදවීමට බියක් දක්වනුයේ මෙම ව්‍යාපාරය අවදනම් සහිත වන බැවිනි. වී මෝල් හිමියන් පවසන්නේ බැංකු ණය ලබාගෙන ව්‍යාපාරයට පිවිසි හෝ ව්‍යාපාරය ආරක්ෂා කර ගැනීමට උත්සාහ දරූ බොහෝ වී මෝල් හිමියන් පවතින අවදනම් සහගත තත්ත්වය යටතේ අසාර්ථකත්වයට සහ අසීරුතාවන්ට පත්වීමෙන් ඔවුන්ගේ ව්‍යාපාර ගොඩනැගිලි, ඉඩම් පවා බැංකු වෙත පවරා ගෙන ඇති බවයි. ව්‍යාපාරයට මුදල් යොදවා වී මිලට ගෙන තිබෙන අවස්ථාවන්හිදී රජය විසින් සහල් ආනයනය කිරීම නිසා සහල් මිල පහත වැටීම එයට බලපා ඇති එක් හේතුවකි. ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ වී තොග ඉහළ මිලක් යටතේ ප්‍රධාන වී මෝල්හිමියන් විසින් මිලට ගැනීම නිසා බොහෝ විට සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට ලැබෙනුයේ අඩු ගුණාත්මක තත්ත්වයේ වී තොගය. එම වීවලින් සහල් නිෂ්පාදනය සඳහා වැඩි මිලක් දැරීමට සිදුවීමත්

ගුණාත්මක තත්ත්වයෙන් අඩු සහල් සඳහා සාපේක්ෂව අඩු මිලක් ලැබීමත් තුළ එවැනි වී මෝල්හිමියන් ලබන ලාභය අවමවීමත් සිදුවේ. සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් අසාර්ථකවීමට බලපානු ලබන අනෙක් සාධක අතර එම කරුණු ද ප්‍රධාන වේ.

ග්‍රාමීය හා කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට ආයතනික මට්ටමේ ණය ලබා ගැනීමේදී ණය ප්‍රමාදවී ලැබීම, ණය ලබා නොදීම, අවශ්‍ය මුදල ලබා ගැනීමට නොහැකිවීම ආදි ගැටළු හේතුවෙන් ආයතනික මාර්ගයෙන් මූල්‍ය පහසුකම් සපයා ගැනීමට අපහසු බව ද අනාවරණය වේ. මුදල් හිඟකම සහ වී සඳහා එකවර මුදල් ගෙවීමට සිදුවීම මිලට ගනු ලබන වී ප්‍රමාණය සීමා කිරීමට බලපාන බව ව්‍යාපාරිකයන් සහ වී මෝල්හිමියන් සඳහන් කරනු ලබයි.

කෙසේ වුවද ඉහත කී ඇතැම් ගැටළුවලට රජය විසින් මේ වන විට ද පිළියම් යොද ඇති අතර 2004/05 මහ කන්නයේ බැංකු ණය ලබාගත් වී මෝල් හිමියන්ගේ ණය ගෙවීමේ කාල සීමාව දීර්ඝ කිරීම, වී මිලට ගැනීම සඳහා ලබා දෙන බැංකු ණය මුදල් ප්‍රමාණය වැඩි කිරීම එයට නිදසුන් වේ. එමෙන්ම 2006 වසරේදී කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් සඳහා අවශ්‍ය නවීන තාක්ෂණය සහිත යන්ත්‍ර සූත්‍ර තීරු බදු සහන මත ආනයනයට අවසර දීම සිදුකර ඇත. මේ තුළින් මෙම ක්ෂේත්‍රය තුළ පවතින ගැටළු විසඳීමට රජය උත්සාහ දරමින් සිටී.

**ගබඩා පහසුකම් හිඟය**

වී වෙළඳමේ නිරත ව්‍යාපාරිකයන්ට/වී මෝල් හිමියන්ට ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිවීම ඔවුන් මුහුණ දෙන තවත් ගැටළුවකි. ග්‍රාමීය මට්ටමේ අතරමැදි ව්‍යාපාරිකයන් මේ හේතුව නිසා තමන් එදිනෙද මිලට ගනු ලබන වී තොග දිගු කාලයක් ගබඩා කර තබා නොගෙන ඉක්මණින් අලෙවි කිරීම සිදු කරනු ලබයි. මේ හේතුව නිසා වැඩි ලාභයක් ලබා ගැනීමේ හැකියාවක් නොමැති බව සුළු හා මධ්‍ය පරිමාණ අතරමැදි ව්‍යාපාරිකයන්ගේ මතයයි. අස්වනු නෙලා අවසන්වූ පසු වී මිල ඉහළ යන නමුත් ඒ වනවිට ඔවුන් තමන් රැස් කළ වී තොග එදිනෙද අලෙවි කිරීම නිසා ඔවුන් සතුව පවතින්නේ තම ගබඩාවල තබා ගත හැකි මට්ටම් අඩු වී ප්‍රමාණයකි. කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් ද මෙම ගැටළුවට මුහුණදෙනු ලබන අතර සහල් මිල ඉහළ යන අවස්ථාව වනවිට ඔවුන් සතුව වී තොග නොමැති බවත්, එම අවස්ථාවේදී ඔවුන්ට වී සපයා ගැනීම අපහසු බවත්, වී ලබා ගැනීමට ඉහළ මිලක් ගෙවීමට සිදුවන බවත් ඔවුන් විසින් පෙන්වා දේ. ඔවුන් පවසන අන්දමට සහල් මිල ඉහළ යන අවස්ථාවේදී වී තොග සියල්ලම පාහේ පවතින්නේ ප්‍රධාන වී මෝල් හිමියන් කිහිපදෙනෙකුගේ ගබඩා සංකීර්ණයන්හිය. ඉහත කී හේතු මත ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල් හිමියන් ද තමන්ට ප්‍රමාණවත් තරම් ගබඩා පහසුකම් නොතිබීම ප්‍රධාන ගැටළුවක් ලෙසින් හඳුනාගෙන ඇත.

වී මිලට ගන්නා අතරමැදියන් / වී මෝල්හිමියන් මිලදී ගනු ලබන වී ප්‍රමාණය අඩුවීම සඳහා බලපානු ලබන තවත් හේතුවක් වන්නේ ඔවුන් මුහුණ දෙන ප්‍රවාහන ගැටළුවයි. වී මෝල් හිමියන්ගෙන් 11%ට තමන් සතු ප්‍රවාහන පහසුකම් නොමැති අතර මේ නිසා වී මිලදී ගැනීමේ කාර්යයේදී ඔවුන් ක්‍රම දෙකක් අනුගමනය කරනු ලබයි. එනම්,

1. කුලියට ලබාගත් ප්‍රවාහන මාධ්‍ය භාවිතා කිරිම.
2. තම ව්‍යාපාරික ස්ථානයේදී පමණක් වී මිලට ගැනීම වශයෙනි.

ප්‍රවාහන මාධ්‍ය කුලියට ගැනීමේදී ඉහළ මිලක් ඒ සඳහා දැරීමට සිදුවන බවත්, වී සඳහා ගොවීන්ට අඩු මුදලක් ලැබීමට මෙම හේතුව ද දයක වන බවත් ව්‍යාපාරිකයින්ගේ මතයයි. ප්‍රවාහන පහසුකම් නොමැති වී මෝල්හිමියන්ගෙන් 5.6% ක් තම ව්‍යාපාරික ස්ථානයට ගොවීන් හෝ අතරමැදි ව්‍යාපාරිකයන් විසින් රැගෙන එන වී තොග පමණක් මිලට ගනු ලබයි. තම ව්‍යාපාරය දියුණු කිරිමට බලපාන බාධාවක් ලෙසින් ඔවුන් එය සලකනු ලබයි.

**වී මිලට ගැනීමේදී අතරමැදි ව්‍යාපාරිකයන් සහ වී මෝල්හිමියන් මුහුණදෙන ගැටළු සඳහා ඔවුන් ඉදිරිපත් කළ විසඳුම්**

ගුණාත්මක තත්ත්වයෙන් අඩු වී මිලට ගැනීමට සිදුවීම සම්බන්ධ විසඳුම් ලෙස අතරමැදි ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල්හිමියන් ද යෝජනා 03ක් ඉදිරිපත් කරනු ලබයි. එනම්,

i. උසස් ප්‍රමිතියෙන් යුතු වී නිෂ්පාදනය සඳහා ගොවීන්ට උපදෙස් ලබාදීම
ii. සාපේක්ෂව අඩු මිලකට වී මිලදී ගැනීම
iii. අඩු ප්‍රමිතියේ වී ප්‍රතික්ෂේප කිරීම.

උසස් ප්‍රමිතියෙන් යුතු වී නිෂ්පාදනයට ගොවීන්ට උපදෙස් ලබාදීම කළ යුතු බව අධ්‍යයනයට ලක්වූ අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 25% ද, වී මෝල්හිමියන්ගෙන් 15.8% ද සඳහන් කරනු ලබයි. වී මිලට ගැනීමේදී ප්‍රමිතියෙන් යුතු වී නිෂ්පාදනය කරන ලෙස ගොවීන්ට ඔවුන් විසින් දන්වනු ලැබුවත් ඒ පිළිබඳව ගොවීන් සැලකිල්ලක් නොදක්වන බවත් රාජ්‍ය අංශය මේ සඳහා මැදිහත්වී ගොවීන්ට උපදෙස් ලබාදීම තුළින් ප්‍රමිතියෙන් යුතු වී නිෂ්පාදනය කිරීමට පෙළඹවිය හැකි බවත් ඔවුන්ගේ යෝජනාව වේ. ගොයම් පැගීම සඳහා පඩංගු ලබාදීම මේ සඳහා ඉදිරිපත් වන තවත් යෝජනාවකි. මේ සම්බන්ධව අදහස් ඉදිරිපත් කරනු ලබන කෘෂිකාර්මික ක්ෂේත්‍රයට සම්බන්ධ රජයේ නිලධාරීන් පෙන්වා දෙනු ලබන්නේ ගොවි සංවිධාන මට්ටමින් පඩංගු ලබා දීම ක්‍රියාත්මක කර ඇතත් සියළුම ගොවීන්ට පඩංගු ලබා දීමේ හැකියාවක් නොමැති බවයි. එමෙන්ම ගුණාත්මක තත්ත්වයේ වී නිෂ්පාදනය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා දැනට ද ක්‍රියාත්මක කෙරෙන බව ඔවුන් විසින් අනාවරණය කෙරිණි.

ප්‍රමිතියෙන් අඩු වී සඳහා උසස් ප්‍රමිතියෙන් යුතු වීවලට සාපේක්ෂව අඩු මිලක් ලබාදීමේ යෝජනාව අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 47.4% ද වී මෝල් හිමියන්ගෙන් 55.3% ද ඉදිරිපත් කර ඇත. ගල්,වැලි මුසුවූ වී සඳහා කිලෝ ග්‍රෑමයකට ශත 50 සිට රු.2.00 දක්වා මුදලක් අඩුවෙන් ගෙවන බව අධ්‍යයනයෙන් හෙළි විය. එමෙන්ම ඇතැම් ව්‍යාපාරිකයන් විසින් ගල්, වැලි සහිත වී මිලට ගැනීමේදී වී මල්ලකින් (50 කි.ග්‍රෑ.) වී කිලෝග්රෑම් 1-2 අතර ප්‍රමාණයක් හෝ කිලෝ 65 ක වී මල්ලකට කිලෝග්රෑම් 3ක් අඩු කර මුදල් ගෙවන බවත්, තෙත වී මිලට ගැනීමේදී රු.1.00-2.00 අතර මුදලක් කිලෝග්රෑමයකට අඩු කරන බවත් අධ්‍යයනයේදී හෙළි විය. වීවල පැහැය අවර්ණවීම නිසාද වී සඳහා අඩු මිලක් ගෙවනු ලබයි. එහිදී නියමිත වර්ණයෙන් යුතු වීවලට වඩා වී කිලෝග්රෑමයක් සඳහා ශත 20 සිට ශත 75 පමණ මුදලක් අඩුවෙන් ලබාදේ.

නියමිත ප්‍රමිතියෙන් තොර වී ප්‍රතික්ෂේප කිරීම මෙම ගැටළුව සම්බන්ධව ව්‍යාපාරිකයන් සහ වී මෝල්හිමියන් ඉදිරිපත් කරනු ලබන අනෙක් විසඳුම වේ. අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 18.4% ද, වී මෝල් හිමියන්ගෙන් 10.5% ද මෙම අදහස ඉදිරිපත් කරනු ලබයි.

**මුදල් අපහසුතා**

වී මිලට ගැනීමේදී අතරමැදි ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල්හිමියන් ද මුහුණදෙන ප්‍රධාන ගැටළුවක් වන ප්‍රමාණවත් පරිදි මුදල් නොවීමට පිළියම් ලෙසින් ඔවුන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව වන්නේ, ආයතනික මාර්ගයෙන් ණය ලබාගැනීමේදී බලපානු ලබන නීති රීති සහ ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන පිළිබඳ අවශ්‍යතා ලිහිල් කළයුතු බවයි.

අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 42.1% ද වී මෝල්හිමියන්ගෙන් 18.4% ද තම මූල්‍යමය අවශ්‍යතා සඳහා හිතවතුන්ගෙන්, ඥතීන්ගෙන් මුදල් ණයට ලබා ගැනීම සිදුකරන බව සඳහන් කර ඇත. ආයතනික මාර්ගයෙන් ණය ලබා ගැනීමේදී අවශ්‍ය වේලාවට ණය ලබාගත නොහැකිවීම, ණය ලබාදීමට බැංකු අකමැතිවීම, බැංකුවට ඇපයට තැබීමට අවශ්‍ය වත්කම් තමන්ට නොවීම යන ගැටළු හේතුවෙන් ආයතනික මාර්ගවලට වඩා පෞද්ගලික මාර්ගවලින් ණය ලබා ගැනීමට ඔවුහු පෙළඹී සිටිති. මේ හේතුවෙන් ව්‍යාපාරිකයන්ගෙන් 5.3% ද වී මෝල්හිමියන්ගෙන් 25% ද ආයතනික මාර්ගයෙන් අවම ඇපයකට තම ව්‍යාපාර සඳහා ණය ලබාදීමට කටයුතු කළ යුතු බවට යෝජනා කරනු ලබයි.

ව්‍යාපාරිකයන්ගෙන් 5.3% ද, වී මෝල්හිමියන්ගෙන් 10.4% ද මුදල් අපහසුතා නිසා තමන්ට මිලදී ගැනීමට හැකි වී ප්‍රමාණය සීමාවීම තම ව්‍යාපාරයේදී මතුවන බාධාවක් ලෙසින් සඳහන් කරනු ලබයි. ආයතනික මාර්ගයෙන් ණය ලබාදීම තුළින් මෙම බාධාව මඟ හරවා ගැනීමේ හැකියාව ලැබෙන බව ඔවුන්ගේ අදහසයි.

### ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොවීම

ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොවීමේ ගැටළුවට පිළියම් වශයෙන් ක්‍රියාත්මක කළ හැකි යෝජනා 03ක් ව්‍යාපාරිකයන් සහ වී මෝල්හිමියන් විසින් ඉදිරිපත් කර ඇත. එනම්,

i. ගබඩා ධාරිතාව වැඩි කිරීම.
ii. ගබඩා ධාරිතාවට සරිලන ප්‍රමාණය පමණක් මිලට ගැනීම.
iii. වසර පුරා වී මිලට ගැනීම වශයෙනි.

ව්‍යාපාරිකයන්ගේ 5.3% හා වී මෝල්හිමියන්ගෙන් 2.6% මෙම ගැටළුවට පිළියමක් වශයෙන් යෝජනා කරනු ලබන්නේ ගබඩා ධාරිතාවන් වැඩි කිරීමයි. රාජ්‍ය අංශයට අයත් ගොඩනැගිලි කුලියට ලබාදීම හෝ පෞද්ගලික අංශයේ ගොඩනැගිලි කුලියට ලබා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ ණය පහසුකම් ලබාදීම තුළින් මෙම ගැටළුව නිරාකරණය කළ හැකි බව ඔවුන්ගේ අදහසයි.

ගබඩා ධාරිතාවන් අඩුවීම නිසා පවතින ධාරිතාවට සරිලන වී ප්‍රමාණයක් පමණක් මිලට ගැනීම සිදුකරන බව වී මෝල්හිමියන්ගෙන් 13.2% ද, ව්‍යාපාරිකයන්ගේ 7.9% ද සඳහන් කරනු ලබයි. මෙයට අමතරව වී මෝල්හිමියන්ගෙන් 2.6%ක් මෙම ගැටළුවට පිළියමක් ලෙසින් වසර පුරාම වී මිලට ගැනීම සිදුකරනු ලබයි.

### තරඟකාරිත්වය

තරඟකාරිත්වයට මුහුණදීම සඳහා ව්‍යාපාරිකයන්ගෙන් 5.6% ක් ගොවීන් සමඟ සම්බන්ධතා වර්ධනය කර ගැනීම, ඔවුන්ගේ විශ්වාසය ගොඩනැගීම යන උපක්‍රම භාවිතා කරනු ලබයි. මෙයට අමතරව වී මිල ඉහළ යාමේදී ඇතිවන අපහසුතා මග හරවා ගැනීමට අස්වනු නෙලන සමයේදී වැඩිපුර වී මිලට ගැනීම වී මෝල්හිමියන්ගෙන් 2.6%ක් විසින් සිදු කරනු ලබයි.

### වී/සහල් අලෙවියේදී අතරමැදි ව්‍යාපාරිකයන් සහ වී මෝල්හිමියන් මුහුණදෙන ගැටළු

වී මිලට ගන්නා අතරමැදි ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල්හිමියන් එම වී/සහල් අලෙවියේදී මුහුණ දෙනු ලබන ප්‍රධානම ගැටළුව වන්නේ වෙළඳපොළේ වී සහ සහල් මිල පිළිබඳව පවතින අවිනිශ්චිතතාවයි. මෙම මිල අවිනිශ්චිතතාව මෙන්ම වී ප්‍රමිතියෙන් තොරවීම, ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම, රජය විසින් සහල් ආනයනය කිරීමට අවසර දේ යැයි පවතින සැකය හේතුවෙන් වී එකතු කරන්නන් දිගු කාලයක් තබා නොගෙන තම වී තොග අලෙවි කිරීමට කටයුතු කරනු ලබයි. වෙළඳපල තත්ත්වය වෙනස් කිරීමට නොහැකි බව ව්‍යාපාරිකයන්ගෙන් 26.3% ක්

සඳහන් කරනු ලබයි. වෙළඳපොලේ සහල් මිල අස්ථාවරත්වය නිසා වී මිලදී ගත් මිලට ආසන්න මිලකට හෝ වෙළඳපොලේ පවතින මිලට වඩා අඩු මිලකට සහල් අලෙවි කිරීම හෝ වී මෝල් හිමියන්ගෙන් 21.0% විසින් සිදු කරනු ලබයි.

**වගු සටහන් අංක 07 : වී/සහල් අලෙවියේදී වී මිලට ගැනීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන්, වී මෝල්හිමියන් මුහුණ දෙන ගැටළු**

| ගැටළු | ගැටළුවලට මුහුණ දෙන ප්‍රතිශතය | |
|---|---|---|
| | අතරමැදි ව්‍යාපාරිකයන් % | වී මෝල්හිමියන් % |
| මිල අවිනිශ්චිතතාව | 57.9 | 52.6 |
| වී/සහල් ප්‍රමිතියෙන් තොරවීම | 47.4 | 26.3 |
| ප්‍රවාහන පහසුකම් නොවීම | 7.9 | 13.2 |
| ණයට විකිණීමට සිදුවීම/මුදල් එකවර නොලැබීම | 2.6 | 10.5 |
| කල්තබා ගැනීමේදී නාස්තිය වැඩිවීම | 2.6 | 0.0 |
| ප්‍රධාන ව්‍යාපාරිකයන් සමඟ තරඟකාරිත්වය | 7.9 | 23.7 |
| මිලදී ගන්නන් විසින් රවටනු ලැබීම | 2.6 | 0.0 |
| ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකු විසින් මිල හැසිරවීම | 5.3 | 0.0 |
| පිටතින් ලොරි නොපැමිණීම | 5.3 | 0.0 |
| විශාල සහල් තොග සැපයීමට නොහැකිවීම | 0.0 | 2.6 |
| ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම | 0.0 | 2.6 |
| මුදල් ලැබීමේ ප්‍රමාදය | 0.0 | 13.2 |
| සහල් පාරිභෝජනය පහළ යාම | 0.0 | 5.3 |

**මූලාශ්‍ර: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය, 2006, හෙ.කො.ගො.ප.පු. ආයතනය.**

රජය විසින් සහල් ආනයනයට අවසර දේ යැයි පවතින සැකය නිසා කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් මෙන්ම අතරමැදි ව්‍යාපාරිකයන්ද විශාල වී තොග දිගු කාලයක් රැස්කර තබා ගැනීම අවදානමක් ලෙස සලකනු ලබයි. මෙම කාණ්ඩ දෙකම මුහුණදෙනු ලබන තවත් ප්‍රධාන ගැටළුවක් වන්නේ ගොවීන් විසින් ලබාදෙන වී නියමිත ප්‍රමිතියෙන් තොරවීමයි. ගල්, වැලි ඉවත් කිරීම අමතර වියදමක් දැරීමට සිදුවන බවත්, එසේ නොමැතිව ගල්, වැලි සහිත සහල් වෙළඳපොළට නිකුත් කිරීමේදී නියමිත ප්‍රමිතියෙන් යුතු සහල්වලට වඩා අඩු මුදලක් ඒ සඳහා ලැබීමත් මේ සම්බන්ධ ගැටළු වේ. එසේ වුවත් ගොවීන් විසින් තෙත ප්‍රමාණය වැඩි වී අලෙවි කිරීමේදී පෞද්ගලික හිතවත්කම් සහ සබඳතා නිසා බොහෝ විට ඒවා ප්‍රතික්ෂේප කිරීමට නොහැකි වේ. එවැනි වී මිලට ගෙන කල් තබා ගැනීමේදී පුස් සෑදීම නිසා අතරමැදි ව්‍යාපාරිකයන් විසින් වෙනත් ව්‍යාපාරිකයෙකුට හෝ වී මෝල්වලට අලෙවි කිරීමේදී ඇතැම්විට මිලදීගත් මිලට පවා අලෙවි කිරීමට නොහැකි වීම ද ගැටළුවක් ලෙස සඳහන් කර ඇත. මෙවැනි වී මිලට ගන්නා වී මෝල් හිමියන්ට එය අතරමැදි ව්‍යාපාරිකයන්ට තරම් බරපතල ගැටළුවක් බවට මෝල් පත්ව නොමැති බව සංඛ්‍යා සටහන් අංක 06 අනුව පෙන්නුම් කෙරේ. එසේ

වන්නේ එවැනි වී තොග ප්‍රමිතියෙන් යුතු වීවලට වඩා අඩු මිලකට ගෙන ඉක්මණින්ම සහල් බවට පත්කර අලෙවි කිරීමේ හැකියාව පවතින බැවිනි. අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 42.1% පවසන්නේ ප්‍රමිතිය අඩු වී, අඩු මිලට (වැඩි ලාභයක් තබා නොගෙන) අලෙවි කිරීමට සිදුවන බවයි.

කුඩා හා මධ්‍ය පරිමාණයේ වී මෝල්හිමියන් මෙන්ම අතරමැදි ව්‍යාපාරිකයන් ද වී / සහල් අලෙවියේදී මුහුණ දෙන තවත් ගැටළුවක් වන්නේ මහා පරිමාණ ව්‍යාපාරිකයන් සමඟ පවතින තරඟකාරිත්වයයි. මහා පරිමාණ ව්‍යාපාරිකයන් සහ වී මෝල් හිමියන් තම සම්පත් උපයෝගී කර ගනිමින් දිස්ත්‍රික්කය පුරා වී මිලට ගැනීමත්, වී මිල ඉහළ දැමීමත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් මෙන්ම අතරමැදි ව්‍යාපාරිකයන් ද පොදුවේ මුහුණදෙන ගැටළුවකි. මෙයට අමතරව මහා පරිමාණ වී මෝල්හිමියන් තම නිෂ්පාදන මහා පරිමාණයෙන් සිදු කිරීම තුළ ඔවුන්ගේ නිෂ්පාදන පිරිවැය සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්ගේ නිෂ්පාදන පිරිවැයට වඩා අඩුවේ. මේ නිසා මහා පරිමාණ වී මෝල්හිමියන්ට තම නිෂ්පාදන සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්ගේ නිෂ්පාදනවලට වඩා අඩු මිලකට වෙළඳපළට නිකුත් කිරීමට හැකියාව ඇත. මෙම තත්ත්වය තුළ සුළු / මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් අවදානමකට මුහුණ දේ. මහා පරිමාණ මෝල්හිමියන් නිෂ්පාදන අලෙවි කරන මිලටම කුඩා හා මධ්‍ය පරිමාණ මෝල්හිමියන් තම නිෂ්පාදන අලෙවි කිරීමේදී සිදුවන පාඩුව වළක්වා ගැනීමට හෝ එය පියවා ගැනීමට මාර්ගයක් නොමැති අතර මෙම තරඟකාරී තත්ත්වය තුළ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ගේ වී මෝල් පවත්වා ගෙන යාමේ නොහැකියාවකට මුහුණ දේ.

ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල් හිමියන් ද ප්‍රවාහන පහසුකම් හිඟවීම නිසා වී මිලට ගැනීමේ කටයුතුවලදී මෙන්ම වී/සහල් අලෙවියේදී ද ගැටළුවලට මුහුණපානු ලබයි. වී මෝල්හිමියන් පවසන්නේ තමන් සතු ප්‍රවාහන මාධ්‍ය පවති නම්, තම සහල් පිට ප්‍රදේශවලට ප්‍රවාහනය කර අලෙවි කිරීමට ඒ මඟින් හැකියාව ලැබෙන බවත්, වෙළඳපොල තුළට ප්‍රවේශවීමට තමන්ට හැකියාව වැඩි වශයෙන් ලැබෙන බවත්ය. ව්‍යාපාරිකයන්ගෙන් 5.3% ක් වී මිලට ගැනීමට පිටතින් ලොරි නොපැමිණීම ගැටළුවක් ලෙසින් ඉදිරිපත් කරනු ලබයි. මේ හේතුව නිසා ළඟම පවතින වෙළඳපොලට (වී මිලට ගැනීමේ මධ්‍යස්ථානයට හෝ වී මෝල්හිමියන්ට) අඩු මුදලකට වී අලෙවි කිරීමට ව්‍යාපාරිකයන්ට සිදුවේ.

ප්‍රධාන වී මෝල්හිමියන් කිහිපදෙනෙකු විසින් වී මිල සම්බන්ධව පාලනයක් පවත්වාගෙන යාම තමන් වී අලෙවියේදී මුහුණදෙන ගැටළුවක් ලෙසින් ව්‍යාපාරිකයන්ගෙන් 5.3% ක් සඳහන් කරනු ලබන අතර, මේ නිසා වී මිලට ගැනීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන් තමන්ට අඩු මිලකට වී අලෙවි කිරීමට සිදුවන බව සඳහන් කරනු ලබයි.

කෙසේ වුවද, 2003 ජූලි මාසය වන විට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී සඳහා

ගොවියා ලද මුදල සම්බා සඳහා කිලෝ ග්‍රෑමයකට රු. 12.00 ක් ද නාඩු සඳහා කිලෝ ග්‍රෑමයකට රු. 11.00 ක් ද වශයෙන් සැලකූ විට තැම්බූ සම්බා සහල් කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන වියදම රු. 22.11 ක් වූ අතර පිටකොටුව තොග වෙළඳපොල දක්වා පැමිණෙන විට සහල් කිලෝ ග්‍රෑමයක මිල රු. 23.16 ක් විය. වී මෝල් හිමියාට ලැබෙන මුදල මේ අනුව රු. 26.58 ක් වූ අතර කිරුළපන වෙළඳපොලේ සිල්ලර මිල රු. 32.00 ක් විය. මෙහිදී සහල් කිලෝ ග්‍රෑමයකින් මෝල් හිමියා ලබන ලාභය සහ අනෙකුත් වියදම් රු. 3.42 ද, සිල්ලර වෙළෙන්දගේ ලාභය සහ අනෙකුත් වියදම් රු. 4.00 ද වේ. එම කාලය තුළම පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තැම්බූ නාඩු සහල් කිලෝ ග්‍රෑම් එකක් සඳහා වන වියදම රු. 20.29 ක් වන අතර පිටකොටුව තොග වෙළෙඳපොල දක්වා පැමිණීමේදී සහල් කිලෝවක් සඳහා වන වියදම රු. 21.34 ක් විය. මෙහිදී වී මෝල් හිමියාට ලැබෙන මුදල 23.52 ක් වූ අතර කිරුළපන වෙළඳපොලේ සිල්ලර මිල රු. 28.00ක් විය. මේ අනුව වී මෝල් හිමියා ලබන ලාභය ආසන්න වශයෙන් රු. 2.18ක් ද, සිල්ලර වෙළෙන්ද ලබන ලාභය රු. 3.17ක් ද වේ (විජේසූරිය, 2003). සම්බා වී කිලෝ ග්‍රෑම් සියයකින් සහල් කිලෝ ග්‍රෑම් 65ක් ද, නාඩු වී කිලෝ ග්‍රෑම් සියයකින් සහල් කිලෝ ග්‍රෑම් 66ක් ද නිෂ්පාදනය කිරීමට හැකියාව පවතින බැවින් ඉහත පෙන්නුම් කෙරෙන මිල ගණන් අනුව සහල් සැකසුම් කර්මාන්තය මෙන්ම සහල් වෙළඳම පාඩු ලබන කර්මාන්තයක් වීමට පවතින ඉඩකඩ සීමා සහිත වේ.

**වී/සහල් අලෙවියේදී අතරමැදි ව්‍යාපාරිකයින්/වී මෝල්හිමියන් මුහුණදෙන ගැටළු සඳහා ඔවුන් ඉදිරිපත් කළ යෝජනා**

වී එකතු කිරීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 2.6%ක් සහ වී මෝල් හිමියන්ගෙන් 7.9% ක් ප්‍රවාහන ගැටළුවට පිළියමක් ලෙසින් යෝජනා කරනු ලබන්නේ ප්‍රවාහන පහසුකම් සපයා ගැනීම සඳහා රාජ්‍ය අංශයෙන් ණය පහසුකම් සලසාදීම කළයුතු බවයි. වී මෝල් හිමියන්ගෙන් 7.9% මෙම ගැටළුවට පිළියමක් ලෙස වී මෝලට පැමිණෙන ව්‍යාපාරිකයන්ට සහල් අලෙවි කිරීම සිදු කරනු ලබයි. තරඟකාරිත්වයට මුහුණදීම සඳහා ඉහළ ගුණාත්මක තත්ත්වයන්ගෙන් යුතු වී ලබා ගැනීම කළයුතු බවත් ඒ සඳහා ගොවීන් දැනුවත් කිරීම් කළ යුතු බවත් අතරමැදි ව්‍යාපාරිකයන්ගෙන් 7.9%ක් ප්‍රකාශ කරනු ලබයි. රජය විසින් සහල් ආනයනයට අවසරදීම වී මිල අවිනිශ්චිතතාව කෙරෙහි බලපානු ලබන හෙයින් සහල් ආනයනය නතර කළයුතු බව ව්‍යාපාරිකයන්ගෙන් 2.6%ක් විසඳුම් ලෙස ඉදිරිපත් කරනු ලබයි.

මිල අවිනිශ්චිතතාවට පිළියමක් ලෙසින් වී මෝල්හිමියන්ගෙන් 18.4% ඉදිරිපත් කරනුයේ, වී සඳහා සහතික මිලක් නියම කළයුතු බවයි. වී මිල ඉහළ යාමේදී සහල් නිෂ්පාදන වියදම් ඉහළයාම සිදුවන අතර සහල් මිල ඉහළ යාමට මෙය බලපෑමක් වේ. මිල අවිනිශ්චිතතාව තුළ තමන්ට සිදුවන පාඩුව අවම කර ගැනීමට වී/සහල් මිල ස්ථාවර මට්ටමක පවත්වා ගැනීම හේතුවන බව ඔවුන්ගේ අදහසයි. එමෙන්ම රජය විසින් සහල් ආනයනය තහනම් කළයුතු බව වී

මෝල්හිමියන්ගෙන් 7.9% කගේ මතයයි. එමෙන්ම වී මෝල් හිමියන්ගෙන් 7.9% ක් මිල අවිනිශ්චිතතාව නිසා සහල් නිෂ්පාදනය සීමා කරන බව සඳහන් කරනු ලබයි.

සහල් වෙළඳපොලේ ඇති තරඟකාරිත්වයට පිළියම් ලෙසින් ඉහළ ගුණාත්මක තත්ත්වයේ සහල් නිෂ්පාදනය කිරීම (13.1%), ප්‍රදේශයේ සහල් සැකසුම්කරුවන් වැඩි වශයෙන් ප්‍රවේශ නොවන මහනුවර, රඹුක්කන වැනි ප්‍රදේශවලට සහල් අලෙවි කිරීමට මාර්ග සකසා ගැනීම (2.6%), සහල් පරිභෝජනයට පාරිභෝගිකයින් පෙළඹවීම සඳහා ප්‍රචාරාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (2.6%) සිදු කළ යුතු බව වී මෝල් හිමියන් විසින් යෝජනා කරනු ලබයි.

**සාරාංශය**

පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ වී අලෙවියේදී ගොවීන්, අතරමැදි ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල් හිමියන් ද විවිධ ගැටළුවලට මුහුණ දෙනු ලබයි. පූර්ව අලෙවි අවස්ථාවේදී ගොවීන් මුහුණ දෙන ගැටළු අතර ඇසුරුම් සඳහා වාර්ෂිකව ඉහළ මිලක් දැරීමට සිදුවීම, ගබඩා පහසුකම් හිඟය සහ ප්‍රවාහන වියදම් ඉහළ මට්ටමක පැවතීම මෙන්ම නගරයෙන් දුරස්ථව පිහිටි ප්‍රදේශවල නිසි මාර්ග පහසුකම් නොවීම නිසා මතුවන ප්‍රවාහන ගැටළු ප්‍රධාන වේ.

රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන්ගෙන් 95%ක් ද පෞද්ගලික අංශයට වී අලෙවි කිරීමේදී ගොවීන්ගෙන් 85%ක් ද විවිධ ගැටළුවලට මුහුණ දෙනු ලබයි. රාජ්‍ය අංශයට වී අලෙවි කිරීමේදී අවශ්‍ය ප්‍රමිතිය ද ඉක්මවා ගුණාත්මක තත්ත්වය පරීක්ෂා කිරීම, මුදල් ලැබීමේ ප්‍රමාදය, අලෙවි කිරීමේදී සිදුවන ප්‍රමාදයන්, ඇසුරුම් මලු ප්‍රවාහන සහ නාට්ටාම් කුලී සඳහා අමතර වියදමක් දැරීමට සිදුවීම, නිලධාරීන්ගේ වංචනික ක්‍රියා සහ අකාර්යක්ෂමතා, නගරයෙන් දුරස්ථ ප්‍රදේශවල මිලදී ගැනීමේ මධ්‍යස්ථාන හිඟය ප්‍රමුඛ ගැටළු වේ. පෞද්ගලික අංශයට වී අලෙවියේදී අඩු මුදලක් ලැබීම, කිරුම් මිනුම් භාවිතය, ප්‍රධාන වෙළඳුන් කිහිපදෙනෙකුගේ අභිමතය පරිදි වී මිල තීරණය කිරීම ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළු වේ.

අධ්‍යයනයට අනුව වී අලෙවියේදී සාපේක්ෂව ඉහළ මිලක් (සාමාන්‍ය මිල කිලෝවක් සඳහා රු.12.70කි) ලැබෙනුයේ ගොවීන්ගෙන් 10%ක් තරම් අඩු ප්‍රතිශතයකටය. ගොවීන්ගෙන් 9%ක් ඉතා පහළ මිලක් (සාමාන්‍ය මිල කිලෝව සඳහා රු. 10.39කි) ලබා ගන්නා අතර අනික් පිරිස වී කිලෝවක් සඳහා ලබා ගන්නා සාමාන්‍ය මිල රුපියල් 11.72ක් වැනි මුදලකි. වී අලෙවි ක්‍රියාදාමය පිළිබඳව සැලකීමේදී වී සඳහා සාපේක්ෂ වශයෙන් පහළ මිලක් ලැබීම ගොවීන්ගේ පාර්ශවයෙන් ප්‍රධානම ගැටළුව

වන අතර ඒ සඳහා බලපානු ලබන ප්‍රධාන සාධකය වන්නේ වීවල ප්‍රමිතිය පහළ මට්ටමක පැවතීමයි. මෙයට අමතරව ගබඩා පහසුකම් හිඟය. එදිනෙද පාරිභෝජන අවශ්‍යතා මෙන්ම වගා කටයුතු සඳහා ගොවීන් ණය ගැතිවී සිටීම සහ වෙනත් අවශ්‍යතා සඳහා අවශ්‍ය මුදල් සපයා ගැනීමට අස්වනු නෙළූ විගස වී අලෙවි කිරීම ආදී සාධක ද වී මිල පහළ යාම කෙරෙහි බලපා ඇත. අනෙක් අතට කෘෂි නිෂ්පාදන යෙදවුම් සඳහා වන වියදම් සහ පූර්ව අලෙවි අවස්ථා වියදම් දිනෙන් දින වර්ධනය වීම ගොවීන් වී සඳහා අපේක්ෂා කරන මිල ඉහළ යාම කෙරෙහි බලපානු ලබයි.

ගුණාත්මක තත්ත්වයෙන් අඩු වී මිලට ගැනීමට සිදුවීම, ගබඩා පහසුකම් සහ මුදල් අපහසුතා, ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමේ අපහසුව, වී මිල අවිනිශ්චිත වීම වී මිලට ගැනීමේ නිරත අතරමැදි ව්‍යාපාරිකයන් මෙන්ම වී මෝල් හිමියන් වී මිලට ගැනීමේදී/අලෙවියේදී මුහුණ දෙන ගැටළු අතර ප්‍රමුඛ වේ. සාමාන්‍යයෙන් ගුණාත්මක තත්ත්වයෙන් අඩු වී සඳහා ව්‍යාපාරිකයන් විසින් කිලෝ ග්‍රෑමයකට ශත පනහත් රුපියල් දෙකත් අතර මුදලක් අඩු කර ගෙවනු ලබයි.

සහල් අලෙවියේදී වී මෝල් හිමියන් මුහුණ දෙන ප්‍රධාන ගැටළු වන්නේ මිල අවිනිශ්චිතතාව, නියමිත ප්‍රමිතියකට අනුව සහල් නිපදවීමට නොහැකිවීම, ප්‍රධාන ව්‍යාපාරිකයන් සමඟ පවතින තරඟකාරිත්වය සහ රජය විසින් සහල් ආනයනය කිරීම පිළිබඳව පවතින සැකයයි.

ගොවීන්ගේ ගැටළු සඳහා පිළියම් ලෙසින් ඔවුන් ඉදිරිපත් කළ යෝජනා අතර වී කිලෝ ග්‍රෑමයක සහතික මිල රු.15.00-18.00 අතර මිලකට නියම කිරීම, ප්‍රමාණවත් ගබඩා පහසුකම් සහිත රජයේ වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන ප්‍රවාහන දුෂ්කරතා සහිත ප්‍රදේශවල පිහිටුවීම, වී නිෂ්පාදන යෙදවුම් මිල අඩු කිරීම, රාජ්‍ය අංශයේ ජංගම මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ආරම්භ කිරීම, රාජ්‍ය නිලධාරීන්ගේ අක්‍රමිකතා වැළැක්වීමට පියවර ගැනීම සහ වී මිලට ගැනීමේ මධ්‍යස්ථාන ආශ්‍රිතව සහල් සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීම ප්‍රමුඛ යෝජනා වේ.

රාජ්‍ය මැදිහත්වීමෙන් උසස් ප්‍රමිතියෙන් යුතු වී නිෂ්පාදනයට ගොවීන් පෙළඹවීම, ව්‍යාපාර පවත්වා ගෙන යාම සඳහා ආයතනික මාර්ගවලින් ණය ලබාදීමේ නීති රීති සහ කොන්දේසි ලිහිල් කිරීම, ගබඩා පහසුකම් වර්ධනය කර ගැනීමට රාජ්‍ය අංශයේ ආධාර ලබාදීම ව්‍යාපාරිකයන්ගේ ගැටළු සඳහා පිළියම් ලෙස ඔවුන් විසින් ඉදිරිපත් කළ යෝජනා වේ. සහල් අලෙවියේදී වී මෝල් හිමියන් මුහුණ දෙන ගැටළුවලට පිළියමක් ලෙසින් රජය විසින් සහල් ආනයනය නතර කිරීම, සහල් පරිභෝජනය පිළිබඳ ප්‍රචාරාත්මක වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමත් කළ යුතු බව වී මෝල් හිමියන්ගේ යෝජනා අතර ප්‍රමුඛ වේ.

## නිගමන

ප්‍රමිතියෙන් ඉහළ වී නිෂ්පාදන සඳහා ගොවීන් දැනුවත් කිරීම සහ පෙළඹවීම මඟින් වී මිල සම්බන්ධ ගැටළු අවම කිරීමට කටයුතු කළ හැකිය. එමෙන්ම ගොවිජන බැංකු හරහා වගා කටයුතු සඳහා ලබාදෙන කෘෂි යෙදවුම් ප්‍රමාදයකින් තොරව ලබා ගැනීමට අවස්ථාව සැලසීම මඟින් වගා කටයුතු සඳහා ගොවීන් පෞද්ගලික අංශයට ණය වීම අඩු කිරීමට හැකියාව ඇත. එමෙන්ම දැනටද ක්‍රියාත්මක වන ආකාරයේ රාජ්‍ය මැදිහත්වීමකින් වී මිලට ගැනීමට කටයුතු දිගටම පවත්වා ගෙනයාම මඟින් ගොවියාට වාසි දයක වන අන්දමට වී මිල කෙරෙහි කිසියම් බලපෑමක් කිරීමේ හැකියාව පවත්වා ගැනීමට සිදුවේ. මෙම මැදිහත් වීම සිදු කිරීමේදී අස්වනු නෙළන කාල සීමාව ආරම්භයේදීම මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ආරම්භ කිරීමට කටයුතු කළ යුතු අතර නගරයෙන් දුරස්ථව පිහිටි මාර්ග සහ ප්‍රවාහන පහසුකම් දුර්වල මට්ටමක පවතින ප්‍රදේශවල වී මිලදී ගැනීමේ කටයුතු කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුවේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


01. කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය (1998), නිදහස් ස්වර්ණ ජයන්ති සංග්‍රහය, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය, කොළඹ.

02. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, (2004). සංඛ්‍යාන නිබන්ධන - 2004, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, කොළඹ.

03. දමයන්ති එම්.කේ.එන්. සහ බුලංකුලම, එස්.ඩබ්.ජී.කේ. (2006), පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වී අලෙවිය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, කොළඹ 07.

04. විජේසූරිය, ඩබ්.ජ්.එන්. (2003), සහල් අලෙවිකරණ ක්‍රියාවලිය තුළ දැරීමට සිදුවන වියදම් පිළිබඳ විශ්ලේෂණය (අමුද්‍රිත වාර්තාව), හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, කොළඹ 07.

05. ශ්‍රී ලංකා මහ බැංකුව (2005), වාර්ෂික වාර්තාව - 2005, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

06. Bogahawatta, C (1985), Impact of Government Marketing Policies on the Changes in Paddy Marketing System, University of Peradeniya.

07. Somarathna W.G. (1987), Some Aspects of Paddy/Rice Marketing in Sri Lanka, M.Sc thesis.